# ලෝකාලෝකය

## 2023 දෙසැම්බර් කලාපය

*"නත්තල ඔබෙත් මගේත් දෙවියන්වහන්සේගේත් ආදර කථාවය"*

**දෙවියන්වහන්සේ ස්වකීය
ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම්
ලෝකයාට ප්‍රේම කළසේක.
එසේ කළේ උන්වහන්සේ (යේසුස්වහන්සේ)
කෙරෙහි අදහාගන්නා විනාශ නොවී
සදාතන ජීවනය ලබන පිණිසය
(යොහාන් 3:16)**

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901




# යටහත්ව සිටිමු



ආදරණීය දුවේ, පුතේ,

ඔන්න එකෝමත් එක රටක එක්තරා ගමක ජීවත් වුණා බොහෝම අහිංසක ගම්වැසියන් පිරිසක්. ඔවුන් හැමදෙනාම, තම තමන්ගේ රැකියාවල නිරත වෙමින් ඉතා සමඟියෙන් ජීවත් වුණා. මෙහෙම ඉන්න අතර මේ ගමට අමුත්තෙක් පැමිණියා. ඇත්තටම ඔහු ආවේ ගමේ පාසැලේ දරුවන්ට අකුරු උගන්වන්නටයි. මේ ගුරුවරයා බොහෝම දක්ෂයි සහ ලස්සනයි. ගමේ හැමදෙනාම මේ ගුරුතුමාට බොහෝම ගරුකටයුතුව සැලකුවා මොකද ඔහු ඉතා උගත් පුද්ගලයෙක් නිසා. මෙසේ ටික කාලයක් ගතවුනා. මේ ගුරුවරයා බොහෝම වෙනස් පුද්ගලයෙක් බවට පත්වුණා. මොකද ඔහු හැම වෙලාවකම ඔහුට තිබුණ දැනුම සහ ඔහුගේ ලස්සන ගැන හරිම ආඩම්බර කමකින් තමයි හැසිරුනේ. ඉතින් ඔහුට ගම්වැසියෙක් මුණගැසෙන සෑම මොහොතකම ඔහු ඔවුන්ගේ දැණුම පරීක්ෂා කරමින් ඔවුන්ගෙන් විවිධ ප්‍රශ්ණ අසන්නට පටන් ගත්තා. ඒ විතරක් නෙවෙයි එයාලට උත්තර දෙන්න බැරි වුනාම ඔහු විසින් ඔවුන්ව ඉතා පහත් විදිහට බැන වැදී එලවා ගත්තා. ඒ නිසාම ගමේ කිසිම මනුෂ්‍යයෙක් ඔහුව මුණගැසෙන්නට කැමති වුනේ නැහැ. දවසක් මේ ගුරුතුමාට ඒ ගමේ සිට නගරයට යාමට අවශ්‍ය වුනා. ඉතින් නගරයට යාම සඳහා ගඟකින් එගොඩ වීමට සිදුවුණා. ගමේ හැමෝම ඔරුවක් මාර්ගයෙන් තමයි නගරයට ආවේ ගියේ. මේ ගුරුතුමාත් තොටියාට කථාකොට ඔහුව එතෙර කරන මෙන් ඉල්ලා සිටියා.

ඉතින් ගුරුතුමා සහ තොටියා දැන් ඔරුවේ ගමන් කරමින් සිටියා. මේ යන අතරේ ගුරුතුමා ඔහු සතු දැණුම පාවිච්චි කරමින් අහිංසක තොටියා අපහසුතාවයට පත් කළා. හදිසියේම ගඟ මැදදී ඔරුව හිල් වී ඔරුව තුලට වතුර පිරෙන්නට පටන් ගත්තා. තොටියා හොඳටම බය වුණා. ඔහු ගුරුතුමාගෙන් ඇසුවා "ගුරුතුමනි, ඔබ පිහිනන්නට දන්නවාද?" කියා. එවිට ඔහු සමච්චලයට මෙන් සිනාවෙලා තොටියාට බැන වැදුනා. එවිට තොටියා අනේ ගුරුතුමනි මේ ඔරුව තව ටිකකින් ගිලෙන්නයි යන්නේ. ඔරුව ඇතුලට වතුර පිරෙනවා. දැන් ඔබතුමාගේ දැනුම පාවිච්චි කරලා පුලුවන් ආකාරයකට බේරිලා යන්න. එහෙම කියපු තොටියා ගඟට පැනලා පීනාගෙන ඇවිත් ඔහුගේ ජීවිතය බේරා ගත්තා. ඒත් ගුරුතුමා පිහිනන්නට නොදන්න නිසා ගඟේ ගිලී මරණයට පත්වුනා.

දුවේ පුතේ, මේ කථාවෙන් දෙවියන්වහන්සේ අපට කියා දුන් දේව වචනයක් සිහිපත් වෙනවා. ශුද්ධ වූ බයිබලයේ **හිතෝපදේශ පොතේ 16:18** පදයෙහි මෙලෙස සඳහන් වේ. "විනාශයට පළමුවෙන් උඩගුකමද, වැටීමට පළමුවෙන් අහංකාර සිතද වේ" ඔව් දුවේ පුතේ පුංචි ඔයාලත් මේ ගැන හොඳින් කල්පනාකර බලන්න. පුංචි අපේ සිත්වලට සාතන් විසින් ගෙනෙන ආඩම්බරකම්, අහංකාරකම්, උඩගුකම් වාගේ නරක දේවල් මුලුමනින්ම අපේ සිත්වලින් ඉවත් කරන්න ඕනෑ. ඒ වෙනුවට ආදරය, කරුණාව, ප්‍රේමය, අනුන්ට උදවු කිරීම වැනි යහපත් ගුණාංග වලින් අපේ සිත් පුරවා ගන්නට ඕනෑ.

දුවේ, පුතේ ස්වාමී වූ යේසුස්වහන්සේ පුංචි ඔයාලා දෙස ආදරයෙන් බලා සිටිනවා. ඔයාලත් එවැනි යහපත් ජීවිතයක් ගතකරනවාද කියා. පුංචි ඔයාලත් යේසුස්වහන්සේට කීකරුව, යටහත්ව ආදරයෙන් ඉන්න සිතට ගන්න. දෙවියන්වහන්සේ ඔයාලට ගොඩක් ආශිර්වාද කරන සේක්වා. මේ නත්තල් සමයේ යේසුස්වහන්සේගේ ආදර්ශය ලෙස ජීවිතය ගොඩනගා ගැනීමට සිතට ගනිමු.

ආදර,

**- තබීතා නැන්දා -**

# දෙවියන්වහන්සේ ප්‍රේමය ය

**ස්වාමීවූ යේසුස්වහන්සේගේ කරුණාවද, දෙවියන්වහන්සේගේ ප්‍රේමයද, ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහභාගී කමද, නුඹලා සියල්ලන් හා සමඟ වේවා! (2 කොරින්ති 12:9).**




**ප්‍රිය සහෝදර සහෝදරියනී,**

මුලු මනුෂ්‍යය සංහතියේ ගැලවීම උදෙසා පාපයේ වන්දිය ගෙවීමට මෙලොවට පැමිණි ස්වාමීවූ යේසුස්වහන්සේගේ උත්පත්තිය සිහිකරන නත්තල් සමයේදී ඔබ සැමට සාමය, සතුට හා යේසුස්වහන්සේගේ කරුණාව පිරි නත්තලකට සුභ පතමි. එමෙන්ම තව නොබෝ දිනකින් එළඹෙන 2024 නව වසර ඔබගේ සිතේ ආශාවන් ඉටුවන දෙවියන්වහන්සේගේ ආශිර්වාද බහුලව අත් දකින සැමට නිදුක් නිරෝගී යහපත් නව වසරක් වේවායි පතමි! දීර්ඝ විරාමයකින් පසුව ලෝකාලෝක සඟරාව ඔබ අතට පත්කිරීමට දෙවියන්වහන්සේ දුන් මඟපෙන්වීම හා කරුණාව පිළිබඳව මම උන්වහන්සේට ස්තූති කරමි. ලෝකාලෝක සඟරා සේවය පිළිබඳව ඔබත් යාච්ඤා කරන්න. අන් අයට ලෝකාලෝක සඟරාව හඳුන්වා දෙන්න. ඔබට හැකි පමණින් මුද්‍රණ වියදම් හා තැපැල් ගාස්තු උදෙසා දායකවන්න උත්සහ කරන්න. එය දෙවියන්වහන්සේ ඉදිරියේ අනර්ඝ පූජාවක් වනු නොඅනුමානය.

විවිධ වැරදි ඉගැන්වීම් කරණකොට ගෙන දේව දරුවන් අතරමං වී ඇති කිතුණු පරිසරය තුල දෙවියන්වහන්සේගේ වචනය නිවැරදිව දේව ජනතාවට කියා දීමටත්, ඉගැන්වීමටත් ලෝකාලෝක සඟරාවේ උත්සහයයි. ඔබ සැමට දෙවියන්වහන්සේගේ කරුණාවත් අනුග්‍රහයත් ලැබේවා!

- සංස්කාරක -

**එස්. මෙත්තානන්ද**

**077 8813197**

# කානාහි සරණ මංගල්‍යය

**යොහාන් 2** හි සඳහන් කානාහි සරණ මංගල්‍යය සිදුවීම සමහර අයගේ සිත් යම් ආකාරයකින් වික්ශිප්ත කරන සිදුවීමක් ලෙස දකියි. යේසුස්වහන්සේ එහිදී කල මහත් හාස්කමට වඩා උන්වහන්සේ සහ මව වන මරියා අතර ඇතිවූ කෙටි වචන හුවමාරුව මෙයට හේතුවයි. "ස්ත්‍රිය, නුඹෙන් මට කම මොකද? මාගේ වේලාව තවමත් පැමිණියේ නැත". අනේ, අම්මට කතා කරපු හැටි. ඇයි ඔච්චර නපුරු වුනේ. අම්මට කොයි තරම් දුකක් දැනෙන්න ඇතිද? මේව තමයි ගොඩක් අයගේ සිත්වල තියෙන ප්‍රශ්න.

බයිබලය කියවන අය තේරුම් ගත යුතු මූලික දේවල් කිහිපයක් මෙහි තිබේ. බයිබලය දෙවියන්වහන්සේගේ වචනය වුනත් එය ලිව්වේ මනුෂ්‍යයින් විසින්, මනුෂ්‍යයාට, මනුෂ්‍ය භාෂාවෙන්ය. දිව්‍ය සන්නිවේදන ක්‍රමයක් නෙමෙයි බයිබලය කියවීමේදී අප දකින්නේ. මනුෂ්‍යය භාෂාව නිසා එම බසෙහි ඇති සියලුම සීමාවන්, දුර්වලතා, අඩුපාඩු තිබීම නොවැලැක්විය හැකි දෙයක්. බයිබලය දිව්‍ය භාෂාවකින් ලියැවුනා නම් සීමිත අවබෝධයක් ඇති මිනිස් මොළයට එය කොහෙත්ම තේරුම් ගන්න නොහැකිය. ඒ නිසා තමයි ලොව පුරා තිබෙන ඕනෑම මිනිස් බසක ඇති අඩුපාඩු අනෙකුත් සෑම පොතක් වගේම බයිබලයටද බලපායි. එමෙන්ම මුල් භාෂාවෙන් පරිවර්තනය වීමේදී සිදුවන අඩුපාඩුද අප කියවන බයිබලයේ තිබෙන්න පුලුවනි. බයිබලය ලියැවුනේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙන් නමුත් මනුෂ්‍ය භාෂාවෙන්, මනුෂ්‍ය ව්‍යවහාරය අනුවය, කියවන අයගේ විවිධ තේරුම් ගැනීමේ මට්ටම්, ආත්මික කැපවීම, සභාවක් තුල විධිමත්ව බයිබලය හැදෑරීම යනාදී සාධක මත එහි ඇති සමහර කොටස් සමහරවිට මදක් ගැටලුකාරී වන්න පුලුවන්. එමනිසා තමයි බයිබලය ඉතාම කැපවීමෙන්, සභාවේ විධිමත් මගපෙන්වීම මත ශුද්ධාත්මයාණන්ගේ උපකාරයෙන් කියවිය යුත්තේ. අනෙක් පොත් සහ බයිබලය අතර ප්‍රධානතම වෙනස නම් බයිබලය කියවන විට එහි කතෘන් වන ශුද්ධාත්මයාණන්වහන්සේ කියවන පුද්ගලයා සමඟ සිටීම. මේ නිසා තමයි උඩින් පල්ලෙන් හෝ තමන්ගේ ප්‍රඥාවෙන් නොව යාච්ඤාවෙන් පමණක් බයිබලය කියවිය යුතු වන්නේ.

තවත් වැදගත්ම කරුණක් නම් බයිබලය කියවන විට බයිබලයේ පේලි අතර නැති දේවල් නොකියවිය යුතුය. මරියතුමියට කොයි තරම් දුකක් දැනෙන්න ඇතිද? කියන මනඃකල්පිත ප්‍රශ්ණය සමහර අය අනවශ්‍ය ප්‍රශ්ණයක් කරගෙන තිබේ. එහෙත් එහෙම දෙයක් එම කතාවේ සඳහන් වෙලා තියෙනවාද? කොහෙද තියෙන්නේ මරිය තුමිය දුක්වුනා කියලා? නැති දේවල් කියවල වැරදියට තේරුම් ගන්නවා නම් එය එසේ කියවන පුද්ගලයාගේ ප්‍රශ්නයක්. කේන්ති ගියේ මරියට නෙමෙයි. කතාව කියවන අයටය.

බයිබලය ගැන කරුණක් නම් එය ඉතාම සංශිප්තව ලියැවුණු ග්‍රන්ථයක්ය. එහි තිබෙන සෑම අන්තර්ගතයක්ම, තිබූ ඉඩ ප්‍රමාණයේ අඩංගු කල යුතුවිය. සෑම සුලුදෙයක්ම සවිස්තරාත්මකව, එකින් එක ලියවුනා නම් අප දකින බයිබලය මීට වඩා දහස් ගුණයකින් විශාල පොතක් බවට පත් වේ. කරත්තයකින් තමයි එහා මෙහා ගෙනයන්න වෙන්නේ. අත්‍යවශ්‍යයම දේවල් පමණයි සැකැවින් ලියා තිබෙන්නේ. එනිසා, මෙම සිදුවීම තුල මරියා සහ යේසුස්වහන්සේ අතර මීට වඩා දෙබස් සිදුවන්නට ඇත. එම කතාබහ සිදුවන වෙලාවේ ඔවුන්ගේ මුහුණු වල ස්වභාවය, හැඟීම්, සහ වෙනත් ශාරීරික සන්නිවේදන ලියැවී නැත. එනිසා බයිබලය කියවීමේදී අප පිළිපැදිය යුතු ප්‍රධාන සිද්ධාන්තයක් නම්, ලියල තියෙන දේවල්වලට වඩා වැඩි දේවල් කියවන්න එපා.

බයිබලය ලියැවුනු සමයේදී එවකට එම සිදුවීම් වටා තිබූ සංස්කෘතික, සමාජීය, දේශපාලන, ආර්ථික වාතාවරණය ගැන ගැඹුරු අවබෝධයක් තිබිය යුතුයි. භාවිතාවූ සමහර වචන, අපට හුරුපුරුදු වචන අනුව විනිශ්චය නොකළ යුතුයි. "ස්ත්‍රිය" යනු අද අපට හුරු, ගැහැනිය යන අර්ථයෙන් තේරුම් නොගත යුතුයි. එම වචනය බයිබලයේ සඳහන් වන්නේ "gunē" ග්‍රීක් බසින්. යේසුස්වහන්සේ මරියාට ආමන්ත්‍රණය කිරීමේදී භාවිතා කළේ ඒ කාලයේ උන්වහන්සේ කතා කල ඇරමෙයික් බසින්. Gunē ට අනුරූප ඇරමෙයික් හෝ

අපට හුරු වචනය කුමක්ද යනු අප නොදනිමු. අනවශ්‍ය නිගමනවලට එළඹීම ප්‍රඥාගෝචර නොවේ. Gunē යනු එවකට වැදගත් ස්ත්‍රියක් ඇමතීම සඳහා භාවිතා කළ ඉතා ගෞරවනීය වචනයක්. මෙය රැජිනක් සඳහා ද භාවිතා වූ ගෞරව නාමයක්. අද හරියට නෝනා, මහත්මිය, Madame, Lady කියනවා වගේ. මෙවැනි ඇමතුම්ද රටවල් අනුව අදත් වෙනස්වෙනවා. බටහිර රටවල්වල ගැහැනියට Women කියා ඇමතීම සාමාන්‍යය දෙයක්. ලංකාවේ නම් කාටහරි ගෑනි කියලා කිව්වොත් පරුෂ වචන වරුසාවක් අහගන්න පුලුවන්. මම පොඩිකාලේ කොයිතරම් වයසට ගිය ගැහැනියෙකුට වුනත් නමට පස්සේ අක්කා කියලා කියන්න ඕන. ඕනම පොඩි ළමයෙක් ඕනම වයසක ගෑනියෙකුට "අක්කා" කියන කෑල්ල නම අගට දාන්නම ඕනේ. ලීලාවති අක්කා, ඇලිස් අක්කා, තෙරේසා අක්කා... යනුවෙන්. නැතිනම් ඔවුන්ගෙන් ලැබෙන්නේ ඉතා අප්‍රසන්න ප්‍රතිචාරයක්ය.

පොළව මත ක්‍රිස්තුස්වහන්සේගේ සියලු ක්‍රියාවන් ඕනෑම මනුෂ්‍යයෙකුගේ ඕනෑම බලපෑම් සම්බන්ධව ස්වාධීන විය. මෙය උන්වහන්සේගේ මව සම්බන්ධයෙන්ද වලංගු සත්‍යයක්. "ක්‍රිස්තුස්වහන්සේ" යන සේවය නිල වශයෙන් ආරම්භ කළේ කොයි කාලයේදැයි හරියටම අපට කිව නොහැක. එය පියවූ දෙවියන්වහන්සේ විසින් නියම කර තිබූ වෙලාවට සිදුවිය. එහෙත් කානාහි සරණ මංගල්‍යය සිදුවන අවස්ථාව වනවිට යේසුස්වහන්සේ සහ සියලුම මනුෂ්‍යයන් අතර තිබුනේ "ක්‍රිස්තුස්" යන සම්බන්ධයයි. යේසුස්වහන්සේ සහ මරියා අතර තිබුණේද එම සම්බන්ධය මිස "මව සහ පුතා" යන සම්බන්ධය නොවේ. මෙම සිදුවීම අප තේරුම් ගත යුත්තේ එම අර්ථයෙන් පමණයි. එය මරියාද නිවැරදි ලෙස තේරුම් ගත්තාය. ඒ නිසයි ඇය කිසිම හැඟීම්බර ප්‍රතිචාරයක් නොදක්වා ඉතාම සාමාන්‍ය ලෙස කඩිසරව ඉතුරු වැඩවල යෙදුණේය.

කෙසේ වෙතත් අවධාරණය කළ යුතුම දේ වන්නේ යේසුස්වහන්සේ මෙහිදි පව් කලේ නැත. කවුරු මොනවා කිව්වත්, මොන විදිහකින් කියෙව්වත්, "යේසුස්වහන්සේ මෙම කාරණය සම්බන්ධයෙන් පව් කලේ නැත". අප විසින් ඇදහිල්ලෙන් මෙය පිලිගත යුතුමයි. මවට ස්ත්‍රිය ලෙස ඇමතීමෙන් පව් කලානම්, උන්වහන්සේ කුරුසිය මත එල්ලී අවසන් හුස්ම හෙළමින් සිටි මොහොතේදීත් එම පාපයම කල සේක. මන්ද, එම අවස්ථාවේදීත් තම මව ඇමතුවේ ස්ත්‍රිය කියාය. යේසුස්වහන්සේ එම පාපය කලානම් පව්කාරවූ අපට කිසිම බලාපොරොත්තුවක් නැත. මන්ද, අපගේ පව් වෙනුවෙන් මරණයට පත්වීමට උන්වහන්සේ සුදුසු නැත. මෙය සිදුවිය හැකිද? මෙය විග්‍රහ කල යුතුය. මෙම අධ්‍යනය මීට වඩා සම්පූර්ණ ලෙස තේරුම් ගැනීමට නම් ඉදිරියට කියවන්න.

ස්ත්‍රිය යනුවෙන් ආමන්ත්‍රණය කිරීම තුලින් අප නිවැරදි ලෙස තේරුම් ගතයුතු වන්නේ උන්වහන්සේ තව දුරටත් මව වන මරියා සමග පවුල් මට්ටමෙන් බැඳී නැති බවයි. ක්‍රිස්තුස්වහන්සේ ලෙස සිය කාර්යය ඉටු කිරීම සඳහා, සියලු මනුෂ්‍යය බැඳීම්වලින් (තමන්ගේ මව ඇතුලුව) තොරවූ උන්වහන්සේගේ ස්වාධිපත්‍යයමුල්බැසඇත්තේදෙවියන්වහන්සේ සමග පූර්ණ සහයෝගීතාවයක සිටීම හෝ උන්වහන්සේගේ අසහාය අනන්‍යතාවයයි. යේසුස්වහන්සේගේ ජීවිතයේ අවුරුදු තිහට පෙර උන්වහන්සේ ගත්කල ජීවිතය ගැනද සමහර අය තුල කුකුසක් හෝ ඇග කැසීමක් තිබේ. හැමෝම ගැන ඕපදූප හොයනවා වගේ, මෙය යේසුස්වහන්සේ ගැනද ඕපදූප හෙවීමේ පරම මනුෂයය ස්වභාවය. එනම් කැත හිත. ශුද්ධාත්මයාණන්වහන්සේ බයිබලයේ අපට හෙළිදරව් කර තිබෙන්නේ යේසුස්වහන්සේ ගැන අප කියවන දේ පමණයි. උන්වහන්සේගේ මුල් අවුරුදු තිහ ගැන විස්තර අපගේ ගැලවීමට අදාලම නැත. අප එකහෙලාම පිලිගත යුතු එකම සත්‍යය නම්, උන්වහන්සේ උපතේ පටන් ඒ දක්වාම කිසිම පාපයක් නොකර ශුද්ධ ජීවිතයක් ගත කළ සේක. මේ දේ කියන්නේ මා නොවේ. බයිබලය. කොහොමද අපි ඒක දන්නේ? යේසුස්වහන්සේ යොහාන්ගෙන් වතුර බව්තීස්මය ගැනීමට පැමිණි විට සිදුවූයේ කුමක්ද? ශුද්ධාත්මයාණන්වහන්සේ පරවියකු ලෙස උන්වහන්සේ පිටට පැමිණිසේක. අහසෙන් හඬක් පැමිණ, "නුඹ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. නුඹ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි". උපන්දා පටන් එම මොහොත දක්වා යේසුස්වහන්සේගේ පාප විරහිත ජීවිතය තහවුරුවූ දෙවියන්වහන්සේගේ සහතිකය එයයි. බව්තීස්මයට පෙරම යේසුස්වහන්සේ ගැන ශුද්ධාත්මයාණන් කරණකොට ගෙන යොහාන් සාක්ෂි දරමින්, "අන්න, ලෝකයේ පාපය දුරුකරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණන්" බව ප්‍රකාශ කලේය. මෙය යේසුස්වහන්සේගේ පාපයෙන් තොර ජීවිතය ගැන ශුද්ධාත්මයාණන්ගේ සාක්ෂියයි. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ බැටළු

පැටවාණන්. පරණ ගිවිසුම් කාලයේදී පූජා කිරීම සඳහා බැටළුවෙක් ගෙන ඒමේදී එම බැටළුවා කිසිම අඩුවක් නැති, අංගවිකල නොවූ සම්පූර්ණ සතෙකු විය යුතුය. පරණ ගිවිසුමේ මෙම සතුන් පිළිබඳ අංග සම්පූර්ණභාවය බැටළු පැටවාණන්ගේ අංග සම්පූර්ණභාවය පිළිබඳ ඡායාවක් පමණයි. එනම් අපගේ පව් වෙනුවෙන් සිය ජීවිතය පූජා කරන බැටළු පැටවානන් කිසිම කැලලක් හෝ පලුද්දක් නොවූ කෙනෙකු විය යුතුය. එම බැටළු පැටවා පූජා කිරීම සඳහා ඔහු දෙවියන්වහන්සේ ඉදිරියේ මිහිරි සුවඳක්ව තිබූ පූජාවක් විය යුතුය. මෙය පාප පූජාවක් නොව දවන පූජාවකි. පාප සහ අපරාධ පූජා පව්වලින් වැසී තිබූ නිසා එය කූඩාරමෙන් පිටතට ගෙන ගොස් දැවිය යුතුය. අපගේ පාපයන් දරාගත් මොහොතේ දී යේසුස්වහන්සේද අප වෙනුවෙන් පාප සහ අපරාධ පූජාවක් වූ නිසා උන්වහන්සේගේ කුරුසියද (පූජාසනය) නගරයෙන් පිට තිබුණේය. නමුත් මිහිරි සුවඳක්ව තිබූ පූජාව එසේ කූඩාරමෙන් පිට ගෙනයා යුතු නැත.

යේසුස්වහන්සේ අප වෙනුවෙන් පාප පූජාව බවට පත්වීමට පෙර දෙවියන්වහන්සේ ඉදිරියේ මිහිරි සුවඳක්ව තිබූ පූජාවක් වූ සේක. එම පූජාව දෙවියන්වහන්සේ ඉදිරියේ බැටළුපැටවානන් ලෙස පිලිගත යුතු විය. බව්තීස්මය සිදුවූ මොහොතේ දී දෙවියන්වහන්සේ තහවුරු කළේ යේසුස්වහන්සේ එම මිහිරි සුවඳක්ව තිබූ බැටළු පැටවානන් ලෙස දැනටමත් පිළිගෙන තිබූ බවයි.

කානාහි සරණ මංගල්‍ය සිදුවුනේ මෙම සිද්ධියෙන් පසුවය. උපතේ පටන් ඒ දක්වාම යේසුස්වහන්සේ පවු නොකර සිටි සේක. ඉන්පසුව? එනම් එතැන් පටන් කුරුසිය දක්වා!

නැවත අපට බව්තීස්මයේදී ඒ හා සමාන දෙවියන්වහන්සේගේ හඬ ඇසෙනවා උන්වහන්සේගේ අන්වෙසක් වීමේ සිද්ධියේදී "මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය", දෙවියන්වහන්සේ නැවත එය තහවුරු කල සේක. යේසුස්වහන්සේ පාප රහිත ජීවිතයක් ගතකල සේක.

මරියාව ස්ත්‍රිය ලෙස ආමන්ත්‍රණය කිරීමෙන් හෝ ඇයට ඒ ආකාරයෙන් සැලකීම සම්බන්ධ කාරණයේදී උන්වහන්සේ පව් නොකළ බව කිසිම සැකයක් නැතිව අපට පැහැදිලි වෙයි. එමනිසා එම සංසිද්ධිය අප පැහැදිලි කරගත යුත්තේ වෙනත් ආකාරයකින්ය.

"ස්ත්‍රිය, නුඹෙන් මට කම මොකද?" නුඹෙන් මට කම මොකද යන්න ග්‍රීක් බසින් සඳහන්වන්නේ ti emoi kai soi ලෙස. මෙහි නියම අර්ථය පිළිබඳව පූර්ණ එකගතාවයක් විද්වතුන් අතර නැත. යේසුස්වහන්සේගේ වචන ඇරමයික් බසින් වීම එක හේතුවක් වන්නට ඇති. එහෙත්, එය තරමක් තේරුම් ගැනීමට අමාරු කියමනක් බව බොහෝ අයගේ මතයයි. එමනිසා, අප ඒ ගැන අනවශ්‍ය ලෙස හෝ ව්‍යාකූල ලෙස කලබලකාරී තත්වයකට පත් නොවී සාමාන්‍ය ආකාරයට තේරුම් ගත යුතුය. ග්‍රීක් පරිවර්තනයේ සෘජු අදහස වන්නේ, මේ කාරණය (මිදියුෂ අවසන් වීමේ) ගැන නුඹ සහ මා අතර ඇති සම්බන්ධය කුමක්ද? එසේ නැතිනම්, නුඹ සහ මා අතර මේක මොකක්ද?

ඉහත කියමන මෙම කියමන සමග තේරුම් ගත යුතුය. "මාගේ පැය තවම පැමිණ නැත". මෙය ක්‍රිස්තුස්වහන්සේ ලෙස පොළොවේ දී උන්වහන්සේ කටයුතු කරන ආකාරය පිළිබඳ ප්‍රශ්ණයක්. එනම්, මෙය මුලුමනින්ම දෙවියන්වහන්සේගේ කැමැත්ත සම්බන්ධ කාරණයක්. යේසුස්වහන්සේගේ පැය යනු උන්වහන්සේගේ යම් ක්‍රියාවක් කළ යුතු වෙලාවයි. මාගේ පැය යනු යේසුස්වහන්සේ මහිමයට පැමිණීමේ වේලාව. එම වේලාව නම් උන්වහන්සේ කුරුසිය මත එසවීම සහ මරණය පරදා නැවත නැගිටීමට වේලාව. යේසුස්වහන්සේ පොළොව මත කලාවූ සෑම දෙයක්ම වූයේ එම වේලාව අරමුණු කරගෙනය. එම නිසා සෑම සිදුවීමක් සඳහාම දෙවියන්වහන්සේ විසින් නියම කරන ලද වේලාවක් තිබුනි. අප වගේ නොව එම වේලාව පැමිණෙන තෙක් ඉවසීමෙන් සිටීමට යේසුස්වහන්සේ පුරුදුව සිටිය සේක.

මෙම කතාවේදී යමෙක් පව් කලානම් එසේ කලේ යේසුස්වහන්සේ නොව, මරියාය. ඇය පව් කලා යැයි මම කිසිසේත්ම අදහස් නොකරමි. එහෙත්, ඒ ගැන යම් හෝ සැකයක් තිබේ නම් එම පාපය කලේ ඇයයි. යේසුස්වහන්සේ සහ ඇය අතර එම අවස්ථාවේ තිබූ සම්බන්ධය හරි ලෙස පිළිනොගෙන ක්‍රියාකිරීම, යේසුස්වහන්සේගේ පැය එළඹෙන තෙක් නොසිට හදිසිවීම, මිදියුෂ ගැන යේසුස්වහන්සේට පෙර ඇය දැනසිටියායි සිතීම, පුතා ගැන තිබූ අහංකාරය.

**- ඇලෙක්ස් පෙරේරා -**

# එපීස පොතේ සැඟවුණු ආත්මික සම්පත්

(පළමු කොටස)

එපීස පොත යනු දෙවියන්වහන්සේගේ සදාකාලික අරමුණු බෙහෙවින්ම අපට හෙළි කරන බයිබලයේ අද්විතීය පොතකි. බයිබලයේ සඳහන් ලෙස දෙවියන්වහන්සේ සෑම දෙයක්ම එනම් මැවීම, මාංශවත් වීම, කුරුසියේ ඇණ ගැසීම, සමාව දීම, නැවත නැගිටීම සහ සභාව පිහිටුවීම යන දේ කළේ කුමන හේතුවක් නිසාද? මේ සියල්ල දෙවියන්වහන්සේ විසින් සිදු කර ඇත්තේ උන්වහන්සේගේ සදාකාලික අරමුණු පෙරදැරි කරගෙනය. උන්වහන්සේ කිසි විටෙක කඩිමුඩියේ හෝ සදාකාලික අතීතයට යන සැලැස්මකින් තොරව ක්‍රියා කර නැත.

පොළොවේ අත්තිවාරම් දැමීමට පෙර, එනම් මේ ලෝකය මැවීමට පෙර දෙවියන්වහන්සේ කළ දේවල් කිහිපයක් එපීස පොත අප ඉදිරියට ගෙන එයි. එවැනි දේවල් පිළිබඳ දැනුම සහ අවබෝධය, අපගේ කිතුණු ජීවිතයේ අද අප සිටින්නේ උන්වහන්සේගේ සදාකාලික අභිප්‍රායෙහි කොටසක් ලෙස මිස හුදෙක් අපගේම තෝරාග ැනීම පමණක් මත නොවන බවට පූර්ණ සහතිකයක් අප තුළ ඇති කරවයි.

**<u>ලෝකයේ අත්තිවාරම් දැමීමට පෙර දෙවියන්වහන්සේ කළ දේවල් හතක්</u>**

01. ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරාගැනීම - 1:4
02. පුත්‍රකමට පිළිගැනීමට අප කලින් නියම කිරීම - 1:5
03. උරුමයක් ලබා ගැනීම සඳහා අප කලින් නියම කිරීම - 1:11
04. අප කළ යුතු යහපත් ක්‍රියා කලින් සූදනම් කිරීම - 2:10
05. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ යුදෙව්වන් හා අන්‍යජාතීන්ගේ ඒකත්වය කලින් නියම කිරීම - 3:4-6
06. දෙවියන්වහන්සේගේ බහුවිධ ප්‍රඥාව දේවදූතයන්ට, සභාව මගින් පෙන්විය යුතු බව කලින් නියම කිරීම - 3:10,11
07. සභාවට ප්‍රේම කොට ගැලවීමේ සැලැස්ම සකස් කිරීම - 5:25

*<u>01. ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරාගැනීම 1:4</u>*

දෙවියන්වහන්සේ විසින් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරා ගැනීම, දෙවියන්වහන්සේ අප කෙරෙහි දක්වන සදාකාලික ප්‍රේමය ගැන අපට සිහිපත් කරයි. දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍යය සහ මිනිසාගේ වගකීම ගැන නිමක් නැති තර්කවලට පැටලීමෙන් අපට ලැබෙන වාසියක් නැත. ඒ වෙනුවට අප අවධානය යොමු කළ යුත්තේ දෙවියන්වහන්සේ අපට දක්වන පුදුමාකාර ප්‍රේමය කෙරෙහිය. දෙවියන්වහන්සේ ලෝකයේ අත්තිවාරමට පෙර ක්‍රිස්තුස්වහන්සේ තුළ අපව තෝරාගැනීමෙන් අදහස් කරන්නේ පව්කාර මිනිසාගේ මිදීම සඳහා තම පුත්‍රයා යම් දවසක මරණයට පත් කරන බව උන්වහන්සේ දැන සිටි බවයි. දෙවියන්වහන්සේ තම පුත්‍රයාගේ මරණය අතීත සදාකාලයටම සහ පෘථිවියේ මිනිස් පැවැත්ම පුරාම ද උන්වහන්සේගේ හදවතේ දරාගෙන සිටිසේක. ඒ සිතුවිල්ලේ ගුප්තමය බව හා ගාම්භීරත්වය බලන්න! සදාකාලික ප්‍රේමය පූර්ණව දැන ගැනීමට අප අපොහොසත් වුවත් ඒ ගැන යම් අදහසක් ලැබීමට මෙම වචනය ප්‍රමාණවත් වේ. උන්වහන්සේගේ පුත්‍රයාගේ මරණය පිළිබඳ මේ සිත් වේදනාව සදාකාල අතීතය පුරාම උන්වහන්සේගේ හදවතේ තිබෙන්නට ඇත. අපි උන්වහන්සේගේ ප්‍රේමය කල්වාරියේදී දකින අතර අපි එම ප්‍රේමය විස්තර කිරීමට පසුගිය වසර දෙදහසක් පුරා උත්සහ කළෙමු.

අපේ එකම පුතා අනාගතයේ යම් දිනෙක මරා දැමීමට නියමිත බව දැන සිටියහොත් අපෙන් ඕනෑම කෙනෙකුගේ හදවතේ ඇතිවන ශෝකය ගැන සිතා බලන්න. අප, අපේ පුතා ගැන කොච්චර දුක් වෙනවා ඇතිද? ඒ දවස ළං වෙද්දී අප

කොපමණ නොසන්සුන් වෙයිද? දෙවියන්වහන්සේ ඒ අත්දැකීම හරහා සදාකාලිකව ගමන් කළ අතර "මාගේ කාලය තවම පැමිණ නැත" යනුවෙන් පුත්‍රයාණන් කිහිප වතාවක්ම සඳහන් කරනු ඇසීම පියාණන්ගේ හදවතේ වේදනාව කෙතරම් විශාල කරවන්නට ඇත්ද? ඔව්, උන්වහන්සේගේ කුරුසියේ ඇණ ගැසීමේ කාලය ළං වෙමින් තිබුණි. එසේ වුවද දෙවියන්වහන්සේ, තමන්වහන්සේගේ ශුද්ධ සැලැස්මෙන් ඉවතට නොගිය සේක. දෙවියන්වහන්සේ ලෝකයේ අත්තිවාරමට පෙර ක්‍රිස්තුස්වහන්සේ තුළ අපව තෝරා ගැනීම යනු දෙවියන්වහන්සේ තම පුත්‍රයාගේ මරණය හරහා අපට ප්‍රේම කිරීමයි. ඔව්, මේ තමයි "ලොව පෙම් සෑම ඉක්මවන දෙව් ප්‍රේමය". මේ තමයි "මා අත්නොහරින ප්‍රේමය" මේ තමයි "ගැලවීමේ සැලැස්ම පිළියෙල" කළ උත්තරීතර ප්‍රේමය.

<u>02. පුත්‍රකමට පිළිගැනීමට අප කලින් නියම කිරීම 1:5</u>

මෙම පදය අපට හෙළි කරන මහා කතාන්දරය ශ්‍රේෂ්ඨය, තේජාන්විතය. ඒ නිසාම සතුරා වන යක්ෂයා, අප ඒ කෙරෙහි එතරම් අවධානය යොමු නොකරන පරිදි කටයුතු සලසයි. බොහෝ දෙනාට මේ පදය ගැන ඇත්තේ දුර්අවබෝධයකි. දෙවියන්වහන්සේගේ අරමුණු ඉටු නොවන පරිදි මෙම පදයේ තේරුම නිසි ලෙස නොදැන සිටීම කණගාටු දායකය.

බොහෝ බයිබල් ශිෂ්‍යයන් වැරදියට සිතන්නේ "පුත්‍රයන් වීමට කලින් නියම කිරීම" යන්නෙන් අදහස් කරන්නේ අපව දෙවියන්වහන්සේගේ පවුලට හදාගන්නට බාරගෙන ඇති බවයි. අපව දරුකමට හදාගෙන නොව, අපි දෙවියන්වහන්සේගේ පවුලට උපත ලැබ සිටිමු. අප දෙවියන්වහන්සේගේ පවුලට ඇතුලු වූයේ නව උපතකින් මිස ලෝකයේ ඇතැම් විට සිදුවන ආකාරයේ දරුකමට හදා ගැනීමේ ක්‍රියාවලියකින් නොවේ. එසේ නම් පුත්‍රකමට පිළිගැනීම යන්නෙන් ශුද්ධ ලියවිල්ලේ අදහස් කරන්නේ කුමක්ද? ක්‍රිස්තුස්වහන්සේ තුළ අපව තෝරා ගත් පසු, දෙවියන්වහන්සේ අපව කලින් නියම කර ඇත්තේ කුමක් සඳහා දැයි **රෝම 8:23** හි හෝඩුවාව දක්නට ලැබේ. එහිදී පුත්‍රකමට පිළිගැනීම යන වචනය ශුද්ධ ලියවිලිමය වශයෙන් අර්ථ දක්වා ඇත. "...අප පුත්‍රකමට පිළිගැනීම, එනම් අපගේ ශරීරයේ මිදීම බලා සිටිමු". දැන් මේ පදයෙන් ඇඟවෙන්නේ පුත්‍රකමට පිළිගැනීම අනාගතයේ පවතින බවයි. රෝම 8 හි මෙම අදහස කෙරෙහි වැඩි ආලෝකයක් ලබා දී ඇත. "මැවිල්ලේ උනන්දු ප්‍රාර්ථනාව නම් දෙවියන්වහන්සේගේ පුත්‍රයානන්ගේ ප්‍රකාශවීමයි" (රෝම 8:19). මුලු මැවිල්ලම මෙම විශිෂ්ට සිදුවීම, එනම් දෙවියන්වහන්සේගේ පුත්‍රයන්ගේ ප්‍රකාශ වීම බලා සිටියි. ශුද්ධ ලියවිල්ලේ පුත්‍රකමට පිළිගැනීම යන්නෙහි ප්‍රකාශිත අර්ථය වන්නේ " දෙවියන්වහන්සේගේ පුත්‍රයන් (දියණියන්) ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම" යන්නයි. උන්වහන්සේ විශ්වයේ වේදිකාව මත උන්වහන්සේගේ දූ පුතුන් ලෙස දිනක් අපව ඉදිරිපත් කිරීමට යන්නේ ය. **"ඉතින් ඔබව නොපැකිලෙන ලෙස ආරක්ෂා කරන්නත්, උන්වහන්සේගේ තේජස ඉදිරියෙහි කැළැල් රහිතව තබන්නත් සමර්ථ වූ තැනැන්වහන්සේට...." (යුද් 24).**

දෙවියන්වහන්සේ, මේ විශ්වයේ සිටින සියලුම දෙනා ඉදිරියේ උන්වහන්සේ විසින් කරන්නට යන මෙම උතුම් පිළිගැනීමට අපව කලින් නියම කර ඇත. මෙම සිතුවිල්ල සෑම ඇදහිලිවන්තයෙකුම දිරිමත් කළ යුතුය. අද අපට සිදුවෙමින් පවතින සියල්ල අනාගතයේ සිදුවන ඒ මහා පිළිගැන්වීමට සූදානම් වීම උදෙසා ය. දෙවියන්වහන්සේ සොයන්නේ සම්පූර්ණ ලෙස වැඩුණු දූ පුතුන් මිස ක්‍රිස්තුස්වහන්සේ තුළ ළදරුවන් නොවේ. ස්වාමීවූ යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ මිදීමේ ක්‍රියාව ගැන කතා කරමින් හෙබ්‍රෙව්වරුන්ට ලියූ ලේඛකයා පවසන්නේ **".... බොහෝ පුත්‍රයන් මහිමයට ගෙන යන්නට" (හෙබ්‍රෙව් 2:10)** දෙවියන්වහන්සේ අරමුණු කර ඇති බවයි. ඉතින් ආරම්භයේ සිටම දෙවියන්වහන්සේට විශාල සැලැස්මක් තිබුණි. උන්වහන්සේට අවශ්‍ය වූයේ බොහෝ දූ පුතුන් මහිමයට ගෙන ඒමටයි. එබැවින් උන්වහන්සේ අපව කලින් නියම කළේ **"තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුලුදුලා වන පිණිස උන්වහන්සේගේ පුත්‍රයාගේ ස්වරූපයට සමාන වීමටය" (රෝම 8:29)**. අද අප අත්දකින කුමන සිද්ධියක් තුලින්

වුවද දෙවියන්වහන්සේ අරමුණු කරන්නේ අපගේ චරිතය වඩ වඩා ක්‍රිස්තුස්වහන්සේ මෙන් වෙනස් කිරීමටයි. අපගේ ගතිගුණ වෙනස් විය යුතුයි. ඒ යේසුස්වහන්සේගේ ගතිගුණ වලට අනුරූප වීමටයි.

### 03. උරුමයක් ලබා ගැනීම සඳහා අප කලින් නියම කිරීම - 1:11

ලෝකයේ අත්තිවාරම් දැමීමට පෙර දෙවියන්වහන්සේ කළ තවත් දෙයක් නම් " උරුමයක් ලබා ගැනීමට අපව පූර්වයෙන් නියම කිරීම"යි.

**"තමන්වහන්සේගේම කැමැත්තට අනුව සෑම දෙයක්ම කරන තැනැන්වහන්සේගේ අභිප්‍රායට අනුව පෙර නියම කරනු ලැබ අපි උන්වහන්සේ තුළ උරුමයක් ලබා ඇත්තෙමු" (එපීස 1:11).**

දෙවියන්වහන්සේගේ එක් උතුම් අරමුණක් වන්නේ අපට විශාල ආත්මික උරුමයක් ලබා දීමයි. බොහෝ ඇදහිලිවන්තයන් හට මේ ගැන කිසිම අදහසක් නැති අතර ආත්මික ලෙස දුප්පත් අය මෙන් දිගටම ජීවත් වෙති. ඔවුන්ට සැමවිටම අන් අයගේ උපකාර අවශ්‍යයි. ඔවුහු හැමවිටම තමන් වෙනුවෙන් යාච්ඤා කිරීමට කෙනෙකු සොයමින් සිටිති. එසේත් නැතිනම් ඔවුන්ට සෑමවිටම "දක්ෂ ගුරුවරයෙක්" හෝ "දීමනා සහිත දේශකයෙක්" අවශ්‍යම වේ. එහෙත් දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ අප "ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැන ගත නොහැකි සම්පත්වලින්" පොහොසත් වී සිටීම බව අප සැවොම වටහා ගතයුතු කාලයයි මේ (එපීස 3:8). තවත් ඇදහිලිවතුන් කල්පනා කරන්නේ මරණයෙන් මතු ස්වර්ගයේදී ලැබිය හැකි උරුමය ගැනය. එහෙත් ඉහත පදයේ අපට පවසන්නේ පසුවට ස්වර්ගයේ දී ලැබෙන උරුමයක් නොව දැන් අපට භුක්ති විඳින්නට තිබෙන උරුමයක් ගැනය.

ලූක් 15 හි ඇති අකීකරු පුත්‍රයා පිළිබඳ උපමාව ගැන සිතා බලන්න. එහි 12 වන පදය සැලකිල්ලට නොගන්නේ නම් උපමාවේ සැබෑ අර්ථය අපට මග හැරී යයි. "පියා ගේ උරුමයෙන් තමාට ලැබෙන කොටස බාල පුතා විසින් ඉල්ලූ විට පියා තම සම්පත් ඔවුනට බෙදා දුන්නේය". සම්පත් බෙදා දුන්නේ පොඩි පුතාට පමණක් නොවන බවත් පියා විසින් පුතුන් දෙදෙනාටම සම්පත් බෙදා දුන් බවත් අපි දැකිය යුතුවෙමු. පසුව, බාල පුතා සියල්ල නාස්ති කර ආපසු පියා වෙතට හැරී ඒමත් පියා ප්‍රේමයෙන් සහ සමාව දීමෙන් ඔහු පිළිගැනීමත් සිදුවූ පසු ලොකු පුතාගේ පැමිණිල්ල කුමන ආකාර වූයේ දැයි කියවන්න. **"එහෙත් මාගේ මිතුරන් සමග විනෝද වීමට ඔබ මට කිසි දිනක එළු පැටවෙකුවත් දුන්නේ නැත" (ලූක් 15:29).** කරුණාකර බලන්න මේ ලොකු පුතාගේ සෝචනීය තත්වය. ඔහුටත් මුලදී පියා ගේ ධනයෙන් කොටස පියා විසින් ලබා දී තිබුනත් ඔහු එයින් කිසිවක් භුක්ති නොවිඳ සිටි බව පෙනේ. ඔහු පියාගේ නිවසේම දුප්පතෙක් ලෙස ජීවත් ව සිට තිබේ.

වර්තමාන කිතුණු ඇදහිලිවන්තයන්ගෙන් බොහෝ දෙනෙක් මෙම ගණයට වැටේ. පියාගේ නිවසට අයිති නමුත් පියාගේ ධනය භුක්ති විඳින්නේ නැත. අන් අයට ආශිර්වාදයක් විය හැකි පරිදි අප ආත්මිකව පොහොසත් වීම දෙවියන්වහන්සේගේ සැලැස්ම හා ආශාවයි. ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත අපව ආත්මිකව පොහොසත් කළ යුතුය. එම සම්පත් සමහරක් මෙලෙස ලයිස්තු ගත කළ හැක.

01. සියලු අවබෝධය ඉක්මවා යන දෙවියන් වහන්සේගේ සමාදානය - **පිලිප්පි 4:7**
02. සියලු දැනුම ඉක්මවා යන ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය - **එපීස 3:19**
03. සොයා දැනගත නොහැකි ප්‍රීතිය - **1 පේත්‍රුස් 1:8**
04. මහිමයේ බලාපොරොත්තුව - **කොලොස්සි 1:27**
05. රන්වලට වඩා බොහෝ වටිනා ඇදහිල්ල - **1 පේත්‍රුස් 1:7**
06. දෙවියන්වහන්සේගේ දරුවන්ගේ තේජාන්විත නිදහස - **8:21**
07. ස්වාමීන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය - **එපීස 1:19**

ඉහත සඳහන් දේවල් අපව ආත්මිකව පොහොසත් කරන අතර එමගින් යොහාන් 10:10 හි ස්වාමීවූ යේසුස්වහන්සේ පැවසූ "බහුල ජීවිතය" අත්විඳීමට අපට උපකාර කරයි. ඉහත ලැයිස්තුවේ ඇති දෑ ඔබ ඇත්තටම අත් දකිනවාද? භුක්ති විඳිනවාද?

**- නෙවිල් ජයසුන්දර -**




# සැබෑ සහනය



පවුලේ බාල දරුවා ලෙස උපත ලද මම. වැඩිමහල් සහෝදරියක්ද විය. මගේ කුඩා කාලය බොහෝ ආර්ථික අපහසුතා මැද ගෙවන්නට මටත් අක්කාටත් සිදුවිය. මගේ පියා පින්තාරු කරුවෙකු වූ අතර මව ගෘහනියකි. පවුලේ බාල දරුවා වූ මම කුඩාකල සිටම ස්වාධීන තීරණ ගැනීමටත්, අභියෝග යන්ට මුහුණ දීමට බය නොවූ නිසාත්, එහි ප්‍රතිඵලය ලෙස ඉතාම ලා බාල වයසේදීම මම විවාහ දිවියට පා තැබුවෙමි. මූලික පාසැල් අධ්‍යාපනය එතැනින් අවසන් වූයේ මගේ කෙලිලොල් ළමාවිය සහ මගේ සුන්දර ජීවිතය ප්‍රපාතයකට ඇද දමමිනි. විවාහය, ප්‍රේමය මෙන් සුන්දර එකක් නොවීය. පවුල් ජීවිතයක වගකීම් දරන්නට තරම් මම මුහුකුරා ගොස් නොසිටි නිසාත්, මා පැතූ සතුටින් පිරුණු ප්‍රේමණීය ජීවිතය නොලැබුණු නිසාත්, මා හදවතින් බොහෝ කඩාවැටුණෙමි. ප්‍රේමය වෙනුවට මා අත්දැක්කේ ඇනුම් බැනුම් සහ ආරවුල්ය. නොසෑහෙන ලෙස ඔහුගෙන් මා ගුටිබැට ද ලදිමි. ජීවිතයම අපායක් වන්නට ගතවූයේ ඉතාමත් ටික කාලයකි. ආර්ථික ප්‍රශ්ණ, මානසික ප්‍රශ්ණ සහ කායික හිංසාවන් නිසා මා දිනෙන් දින රෝගාතුර වන්නට පටන් ගත්තෙමි. මගේ විවාහය නොබෝ කලකින්ම දික්කසාදයෙන් කෙලවර විය.

ලෙඩ රෝග වලින් සුවයක් ලබා ගැනීමට සහ ජීවිතයේ දුක් කම් කටෝලු වලින් සහනයක් ලබා ගැනීමට භාරහාර, බෝධි පූජා සහ තොවිල් වලට දුක් මහන්සියෙන් මා ඉපැයු ධනය මා නාස්ති කළේ ඉවක් බවක් නැතිවය. මාගේ පුතාගේ ඉදිරි අනාගතය සහ ආර්ථිකය සවිමත් කර ගැනීමේ හොඳම මාර්ගය යැයි මට හැඟුණු නිසා මැද පෙරදිග රැකියාවකට මා පිටත්ව ගියේ මේ අතර තුරේය. මුදල් හරි හම්බ කරමින් මා වැඩිපුරම කළේ ලංකාවේ වෙදදුරන්, හා යකදුරන්ගේ බොරු වලට රැවටෙමින් ඔවුන්ගෙන් මගේ ජීවිතයට සහනයක් ලබා ගැනීමට සියලු මුදල් නාස්ති කිරීමය. මම මේ අතර ඇවිදින්නට නොහැකිව ඔත්පල තත්වයකට පත්වුනෙමි. මේ වන විට ලෙබනන් රාජ්‍යයේ රැකියාවක යෙදී සිටි බැවින් මා ඉතා අසරණ තත්වයකට පත්වුනෙමි.

යහලුවන් කිහිපදෙනෙකු තුලින් මා යේසුස්වහන්සේ ගැන අසා තිබුනත් මා ඒ ගැන සැලකුවේ නැත. යේසුස්වහන්සේ තුලින් සහනය ලැබෙන බව මට කීවත්,

මා සිතුවේ යකදුරන්ට සහ වෙදදුරන්ට තරම් කිසිවක් යේසුස්වහන්සේට කළ නොහැකි බවයි. නමුත් දිනෙන් දින මාගේ රෝගී තත්වය උත්සන්න වීමත් සමග යහලුවන්ගේ බලවත් ඉල්ලීම මත සභාවකට යන්නට මම තීරණය කළෙමි. ඊට පෙර දින මිතුරියකගේ මාර්ගයෙන් දුරකථනය ඔස්සේ දේව සේවකයෙකු සම්බන්ධ කරගත් මා යාච්ඤාවකට සවන් දුන්නෙමි. එදින රාත්‍රියේ මගේ හදවතට මහත් සහනයක් දැණුන අතර, බොහෝ



කාලයකට පසු සැහැල්ලු මනසකින් මා නින්දට ගියෙමි. ඊට පසු දින මිතුරියන් දෙදෙනෙකුගේ උදව්වෙන් ලෙබනන් රාජ්‍යයේ සභාවකට යන්නට ඔට පුලුවන් විය. දේව සේවකයෙකු මා සමඟ කථාබහ කර මා සමග යාච්ඤා කරන්නට පටන් ගත්තේය. යාච්ඤාව තුලදී මා නොදත්, නමුත් මට පෙර දිනයේදී හදවතට සහනයක් ලබා දුන් යේසුස්වහන්සේව තදින් විශ්වාස කරමින් යාච්ඤාවට මුලු හදවතින්ම එකඟ වුනෙමි. ඔහු මාගේ ඔත්පල වූ දෙපා මතට අත් තබා යාච්ඤා කර අවසාන වනවාත් සමඟ මට යම් වෙනසක් සිදුවෙනවා දැනුනි. ඒ කුමන ආකාරයේ වෙනසක් දැයි අදටත් මට විස්තර කරන්නට නොහැකි නමුත්, ඒ මොහොතේ මා නැගිට සිටගත්තෙමි. රූප, පිළිම, ගස්ගල්, පූජා, භාරහාර, තොවිල්, යන්ත්‍ර සූත්‍ර සියල්ලම මා අත් හැරියෙමි. මේවා සියල්ල නිශ්ඵලය. යේසුස්වහන්සේ ජීවමාන බව සැබෑවකි. මම ලංකාවට ඇවිත් මගේ පවුලේ අය සමඟ යේසුස්වහන්සේට ප්‍රේම කරමින් ජීවත් වන්නට පටන් ගත්තෙමි. බයිබලයක් ලබාගෙන, ක්‍රමානුකූලව දේව වචනය අධ්‍යනය කරමින් සභාවේ සහභාගීකමට එක්වෙමින්, ඇදහිලිවන්ත සහභාගිකමෙහි මා පැවතුනෙමි. මේ අතරතුර මෙසේ කාලය ගතවන විට යේසුස්වහන්සේට ප්‍රේම කරන අයෙක් උන්වහන්සේ මට හඳුන්වා දුන්සේක. දේව කැමැත්තට අනුව ඔහු සමඟ විවාහ දිවියට ඇතුල් වුනෙමි. අප දැන් ප්‍රීතිමත් විවාහ ජීවිතයක් ගත කරමින් යේසුස්වහන්සේ පැමිණෙන තෙක් හෝ අපගේ ජීවිත කෙලවර දක්වා අප දෙදෙනාම උන්වහන්සේට සේවය කරමු. මට සහනය ලැබුනේ ජීවමාන යේසුස්වහන්සේගෙනි. උන්වහන්සේ අදහා ගත් පසු මට සියලු දේ සම්පූර්ණ වූයේ නැත. නමුත් මා සෙවූ සහනය තිබුනේ උන්වහන්සේ තුලය. අද මා උන්වහන්සේ තුල සිතේ සමාදානය සහ ප්‍රීතිය මහත්සේ භුක්ති විඳින්නෙමි. මරණින් මතු මගේ ජීවමාන දෙවි පියානන් මුණගැසීමේ බලාපොරොත්තුවෙන් සිටින්නෙමි. උන්වහන්සේට ප්‍රශංසා වේවා!!


**- ධම්මිකා මකුළුදූව -**

# දෙවියන්වහන්සේ එවූ ගැළවුම්කරුවාණෝ

ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊශ්‍රායෙල් රටේ බෙත්ලෙහෙම නම් කුඩා ගම්මානයේ උපත ලැබීමේ පුවත මුලු මහත් ලෝකවාසී ජනතාවට මහත් ප්‍රීති උපදවන ශුභ ආරංචියකි. බෙත්ලෙහෙම් නගරයට ආසන්නයේ තිබූ තණ පිටියක බැටළුවන් බලාගනිමින් සිටි එඬේර කණ්ඩායමකට ස්වාමීන්වහන්සේගේ දූතයෙක් ප්‍රකාශවී මෙම මහත් ප්‍රීතිජනක පණිවිඩය පැවසීය. එය ශුද්ධ බයිබලයේ ලියවී තිබෙන්නේ මෙසේය **"භය නොවෙල්ලා, බලව මුළු සෙනගට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි" (ලූක් 2:10)**.

අද ලෝකයේ සිටින බොහෝදෙනා තාවකාලික උත්සවාකාර ප්‍රීතියක් භුක්ති විඳිමින් එම දවස සැමරුවද, **ලූක් 2:10** හී සඳහන් එම ප්‍රීතියේ සැබෑ අරුත නොදනිති. තවද **ලූක් 2:11** හි එම ආරංචිය ප්‍රීතිජනක එකක් වීමට හේතු දක්වා ඇත. එනම් ස්වාමීවූ ක්‍රිස්තුස් නම් ගැළවුම්කරුවෙක් එදින ඉපදීමය. ලෝක ඉතිහාසයේ සිදුවූ අසහායම හා ආශ්චර්යමත් උත්පත්තිය මේ යැයි කීම අතිශයෝක්තියක් නොවේ. කුමක් හෙයින්ද උන්වහන්සේ ස්වර්ගයේ සිට මෙලොවට පැමිණි, දෙවියන්වහන්සේගේ පුත්‍රයායි. **යොහාන් 3:16** හි දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් දෙනතරම් ලෝකයාට ප්‍රේමකල සේකැයි සඳහන් වේ.

පුත්‍රයාණන් "දෙනතරම්" යන්නෙහි අරුත නම් ලෝකයා වෙනුවෙන් මරණයට පත්වීමට එවීමයි. දෙවියන්වහන්සේ තම පුත්‍රයාණන් මෙලොව බිහිවන්නට සැළසූ දිනය වසරේ කුමනදා දැයි අප නිශ්චිත ලෙස දන්නේ නැත. අප දින දර්ශනයේ දෙසැම්බර් 25 සම්මත කරගත් දිනයක් පමණි. කෙසේ වෙතත් යේසුස්වහන්සේ යම් දිනෙක ඉපදුන බව සැබෑය. දෙවියන්වහන්සේ පුත්‍රයාණන් මෙලොවට එවූ බව **යොහාන් 3:17** හිද සඳහන් වන අතර, එසේ එවීමට හේතුවද දක්වා තිබේ. **"දෙවියන්වහන්සේ තම**



**පුත්‍රයාණන් මෙලොවට එව්වේ, උන්වහන්සේ කරණකොටගෙන ලෝකයා ගළවනු ලබන පිණිසය"**. මේ මුළු ලෝකයාටම ප්‍රේමකළ දෙවියන්වහන්සේගේ උතුම්වූ දීමනාවයි. උන්වහන්සේගේ එම ප්‍රේමය කිතුණුවන්ට පමණක් සීමා වු එකක් නොව ලෝකයේ සෑම මනුෂ්‍යයෙකුටම දක්වන ප්‍රේමයකි.

ලෝකයේ පළමු මනුෂ්‍යයා වන ආදම් දෙවියන්වහන්සේගේ අනට අකීකරුවී පාපයට වැටුණු නිසා, උන්වහන්සේ සමඟ ඔහුගේ තිබුනු සම්බන්ධකම කැඩීගියා. ශුද්ධ දෙවියන්වහන්සේට පාපය සමඟ සම්බන්ධකම් පැවැත්විය නොහැක. අප සැවොම දන්නා පරිදි මේ ලෝකයේ පවතින නීතියට අනුව වරදට දඬුවමක් නියම කොට තිබේ. එලෙසම මිනිසා කරන සෑම පාපයකටම දෙවියන්වහන්සේගෙන්වූ දඬුවමක් නියම කොට තිබේ. එදා ආදම් කල පාපය කරණකොටගෙන මරණය හා දුක මෙලොවට පැමිණියෙන්, එහි ප්‍රතිඵල අදද ලෝකයේ දක්නට ඇත. ආදම්ගෙන් පැවත එන සෑම මනුෂ්‍යයා පිළිසිඳ ගැන්මේ සිටම පාපිෂ්ඨයි. ඒ ගැන ශුද්ධ බයිබලයේ මෙසේ සඳහන් වේ. **"බැලුව මැනව, මම අයුතුකම සහිතව සාදනු ලැබීම්, මාගේ මෑණියෝ පාප සහිතව මා ගැබ් ගත්තාය" (ගීතාවලිය 51:5)**. එමනිසා මෙලොව සෑමදෙනා තුළම පාපකාරී ස්වභාවය පවතී. එම නිසා සියල්ලෝම පව් කරති. පාපයට දඬුවම මරණයයි. එය සදාකාලික මරණයකි. **"පාපයේ කුලී නම් මරණයයි...." (රෝම 6:23)**. මෙම භයානක තත්වයෙන් පව්කරුවන් ගළවාගැනීමට පුළුවන්වූ එකදු ශුද්ධ මනුෂ්‍යයෙක්වත් මේ මිහිපිට නැත. **"සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති"**

**යි ශුද්ධ බයිබලය පවසයි (රෝම 3:23).** මේ මහත් කණගාටුදායක තත්වයෙන් අප ගළවා ගැනීමට දෙවියන්වහන්සේ අපට දුන් විසඳුම යේසුස් ක්‍රිස්තුස්වහන්සේයි. උන්වහන්සේ තමයි අපගේ ගැළවුම්කරුවාණෝ. උන්වහන්සේ ඉපදුනු දවසේ දේවදූතයා එඬේරුන්ට පැවසුවේ, ඒ ගැලවුම්කරුවානන්ගේ උපතේ ප්‍රීති උපදවන ආරංචියයි. ගැළවුම්කරුවෙකු අපට ලබාදීමෙන් දෙවියන්වහන්සේ හඟවන්නේ අපගේ පාපයේ දඬුවමින් මිදීමට අපටම තනිව කිසිවක් කරගත නොහැකි බවයි. එම නිසා දෙවියන්වහනසේ පව්කාර මනුෂ්‍යයාට නියමවූ සදාකාලික මරණයෙන් එනම් නිරයෙන් ගළවා ගැනීමට යේසුස්වහන්සේව මෙලොවට එවූසේක. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් නිසා උන්වහන්සේ තුල කිසි පාපයක් නොවීය. ශුද්ධ ධර්මිෂ්ඨවූ දෙවියන්වහන්සේ සමඟ පව්කාර මිනිසාව සමාදාන කරන පිණිස මිනිසාගේ පාපයේ දඬුවම ගෙවාදැමීමට ස්වාමීවූ යේසුස්වහන්සේ මෙලොවට පැමිණි සේක. උන්වහන්සේගේ ජීවිත පූජාව, දෙවියන්වහන්සේට පිළිගත හැකිවූ සම්පූර්ණ නිර්මල පූජාවක් වූයෙන්, එම කැඩුනාවූ සම්බන්ධකම නැවත පිහිටුවා ගැනීමට පව්කාර මනුෂ්‍යයාට මාර්ගය විවර කර දුන්සේක.

දෙවියන්වහන්සේ වෙතට ළඟාවීමටත් ස්වර්ගයට යාමටත් මිනිසා විසින්ම නිර්මාණය කරගත් ආගම් ධර්ම, පාරම්පරික විශ්වාස, මිත්‍යාදෘෂ්ටික ඇදහිලි ක්‍රම අනුග මනය කිරීම නිෂ්ඵල බව දැක්වීමට, මුළු ලෝකයා වෙනුවෙන් "ගැළවුම්කරුවෙක්" දෙවියන්වහන්සේම සපයා දුන්සේක. එසේය දැන් අපගේ පව්කමා කර ගැනීමට දෙඅත් විහිදාගෙන දණහිස්වලින් ඇවිදීමට අවශ්‍ය නැත. කොකුවලින්; එල්ලී එහා මෙහා පැද්දීමට ඕනෑ නැත; ඉටිපන්දම්; තෙල්; මල්; කිරි; පහන්; අවශ්‍ය වන්නේ නැත. නිරාහාරව සිටීම හෝ වෙනත් දුෂ්කර ක්‍රියා කිරීම උවමනා කරන්නේ නැත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට පැමිණ මනුෂ්‍යයා වෙනුවෙන් කල යුතු අමාරුම ක්‍රියාව කර අවසානයි. අප විසින් කරන්නට කිසිම දෙයක් උන්වහන්සේ ඉතුරු කළේ නැත. දෙව්පියාණන්ට අවශ්‍යවූ කර්තව්‍යය උන්වහන්සේ ඉටුකරමින් **"එය නිමයි"** අවසාන හුස්ම හෙළුසේක. උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිට උන්වහන්සේ පැමිණි ස්ථානය වන ස්වර්ගයට පියාණන්වහන්සේ වෙතට නැවත ගියසේක. මරණින් පසු නැවත ජීවමානව සිටින එකම තැනැන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පමණයි. මේ නිසා අප පිහිට උපකාර සැනසිල්ල සොයා රූපයක් පිළිමයක් හෝ වෙනත් දෙයක් කරා යාමට අවශ්‍ය නැත. මන්දයත් යේසුස්වහන්සේ ජීවමානයි. උන්වහන්සේ විශ්වාස කර උන්වහන්සේගේ නාමය කියා යාච්ඤා කලවිට උන්වහන්සේ ඔබට ප්‍රතිචාර දක්වනවාම ඇත. එහෙත් පළමුව ඔබ කළ යුත්තේ, දෙවියන්වහන්සේ සමඟ සමාදාන වීමයි. එසේ කළ හැක්කේ ඔබගේ පාප උදෙසා යේසුස්වහන්සේ කුරුසිය මත දඬුවම් ලැබ මරණයට පත්වූ බව විශ්වාස කිරීමෙනි. ඔබගේ පාපවලට සමාව උන්වහන්සේගෙන් ඉල්ලා, ඔබගේ හදවතට උන්වහන්සේව ගැළවුම්කරුවාණන් ලෙස පිළිගැනීමෙනි. වෙන මාර්ගයක් නැත. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක. **"මාර්ගයද සැබෑවද ජීවනයද මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත" (යොහාන් 14:6).** එසේනම් යේසුස්වහන්සේගේ මව් තුලින්, ශුද්ධවන්තයෙකු තුලින් හෝ වෙනත් යම් පුද්ගලයෙක් තුලින් හෝ නොව යේසුස්වහන්සේ තුලින් පමණක්ම බව පැහැදිලියි.

**"පාපයේ කුලිය නම් මරණයය; නුමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම්, අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල සදාකාල ජීවනයයි" (රෝම 6:23).** මෙම වටිනා දීමනාව ලබාදීමට මීට වසර 2023 කට පෙර දෙවියන්වහන්සේ විසින් ලෝකයාට දුන් මහත් දීමනාව වූ දේවපුත්‍රයාණන් හා ගැළවුම්කරුවාණන් මේ දැන්ම පිළිගෙන ඒ මහත් ප්‍රීතිය අත්දකින්න. මෙය නැති නොවන සදාකාලික ප්‍රීතියක්!! මෙම මහත් ප්‍රීතිය ඔබම පුද්ගලිකව භුක්ති විඳින්න!!

**- ඈන් ජයසුන්දර -**

# යේසුස්වහන්සේ සොයාගෙන රාත්‍රීයේ පැමිණි ගුරුවරයා (යොහාන් 3:1-21)



එක්දිනක් යේසුස්වහන්සේ මුණගැසීමට උගත් මිනිසෙකු පැමිණියා. ඒ රහසිගතව සහ රාත්‍රියේය. ඔහු එම රටේ ප්‍රධාන ආගමික කොමිසමක ප්‍රධාන නිලධාරියෙකි. ඔහුගේ නම නිකදේමුස්ය. ඔහු ඵරිසියෙක්ය. එමෙන්ම ඊශ්‍රායෙල් හී ගුරුවරයෙකි. යුදෙව් ආගම් පරිපාලන කොමිසමේ සාමාජිකයෙකි. ඔහුගේ මෙම ඉහල පෙලේ තනතුරු සහ වගකීම් නිසා අන් අයට හොර රහසින්ම යේසුස්වහන්සේ හමුවීමට පැමිණියා විය හැක. මෙම සිදුවීම බයිබලයේ **යොහාන් 3 වැනි පරිච්ඡේදයේ සඳහන් වේ.**

ඔහු පැමිණ යේසුස්වහන්සේ පිළිබඳ ප්‍රකාශයක් කරයි. එනම් උන්වහන්සේ සමඟ දෙවියන්වහන්සේ සිටින බව ඔහුට හැඟී යන බව පවසයි. ඔහු ඵරිසිවරයෙක් හා ගුරුවරයෙකු බැවින් දෙවියන්වහන්සේ පිළිබඳ පරණ ගිවිසුමේ සඳහන් දේ නොදනී. ඔහුට අවශ්‍ය වූයේ යේසුස්වහන්සේ කවුද කියා දැනගැනීමටය. එසේ නැතිනම් උන්වහන්සේ ක්‍රියා කරන්නේ කුමන, කාගේ බලයෙන්ද කියා දැනගැනීමටය.

යේසුස්වහන්සේ ඒ පිළිබඳ පිළිතුරු දීමට උනන්දුවක් නොදැක්වීය. නුමුත් උන්වහන්සේ නිකදේමුස්ට මෙසේ පැවසීය. "**සැබෑවක්, සැබෑවක්, නුඹට කියමි. යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍ය දකින්නට නුපුලුවන්ය**". බයිබලයේ පරණ ගිවිසුමෙහි ගුරුවරයා වන නිකදේමුස් මෙවැනි දෙයක් මීට පෙර අසා නොතිබුනු බවයි පෙනෙන්නට තිබෙන්නේ. මක්නිසාද නැවත උපදින්නේ කෙසේදැයි ඔහු යේසුස්වහන්සේගෙන් අසයි. නැවත මවගේ කුසතුළට ඇතුල්වී උපදින්නේ කෙසේදැයි අසයි. මෙහිදී යේසුස්වහන්සේ ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වන ආකාරය සංවාදශීලීව පැහැදිලි කර දෙන සේක. **යොහන් 3:1 සිට 21 දක්වා** ඔබත් ඉතා ප්‍රවේශමෙන් කිහිපවිටක් කියවන්න.

නිකදේමුස් ඊශ්‍රායෙල් ගුරුවරයෙක්ව සිටියදී පවා ඔහු දෙවියන්වහන්සේගේ රාජ්‍ය පිළිබඳ නිවැරදි කරුණු නොදැන සිටි අතර යේසුස්වහන්සේ කවුද කියාවත් අනාගත වාක්‍ය අනුව නොදැන සිටියේය.

අපද මේ ආකාරයට යේසුස්වහන්සේ කවුද කියා නිවැරදිව නොදන්නා අය විය හැකිය. උන්වහන්සේ තවත් එක් ආගමික නායකයෙකු හෝ ආගමික ශාස්තෘවරයෙකු යැයි අප සිතිය හැක. එසේ නොවේ, උන්වහන්සේ මනුෂ්‍ය සංහතියේ ගැලවුම්කරුවාය. මේ විශ්වයේ අයිතිකරුවාය. මාංශවත් වූ දෙවියන්වහන්සේය. ස්වර්ගයේ සිට පොළවට බැස පැමිණි ස්වර්ගික තැනැත්තාය.

යේසුස්වහන්සේ නිකදේමුස්ට ආත්මයෙන් හා වතුර කරණකොටගෙන නැවත ඉපදීම පිළිබඳ කථාකල අතර ඒ පිළිබඳ අවධාරණය කල සේක. මෙය භෞතික හෝ ශාරීරික

දෙයක් හෝ ඇසට පෙනෙන හෝ අතින් ඇල්ලිය හැකි දෙයක් නොව. අධ්‍යාත්මික නොහොත් ආත්මික සංසිද්ධියක් බවද උන්වහන්සේ පැහැදිලි කලහ. වතුර වලින් දේව වචනයද **(එපීස 5:26)** අත්මයානන් යනු දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන මනුෂ්‍යයකුගේ ඇතුලාන් තයේ සිදුවන පුනරුදය නොහොත් විපර්යාසය නැවත ඉපදීම නොහොත් දෙවියන්වහන්සේගේ ඉපදීම ලෙසද සඳහන් කල හැක.

දේවවචනය කරණකොටගෙන තමා පවුකාරයෙකු බව දැනගෙන එය තම පාපය හා කාලකන්නිකම ගැන පසුතැවිලි වී යේසුස්වහන්සේ තමන්ට ප්‍රේම කරන බවත් ඒ උදෙසා යේසුස්වහන්සේ තමන්ගේ පාපයේ දඬුවම ගෙවීමට කුරුසියක් මත උන්වහන්සේගේ ජීවිතය පූජා කල බවත් පුද්ගලිකව විශ්වාස කොට තම ජීවිතයට ඇතුල්වන ලෙස උන්වහන්සේට ආරාධනා කොට තම එකම ගැළවුම්කරුවා හා ස්වාමීන්වහන්සේ ලෙස උන්වහන්සේ තම හදවතට පිළිගැනීම සිදුවූ විට එම පුද්ගලයාගේ ජීවිතයේ දෙවියන්වහන්සේ කරන ක්‍රියාව නැවත ඉපදීම වේ. මෙය කිසිම තරාතිරමක මනුෂ්‍යයෙකුට කල නොහැකිය. එය සිදුවන්නේ දෙවියන්වහන්සේ සහ එම පුද්ගලයා අතර පමණි. එය සිදුකරන්නේ දෙවියන්වහන්සේමය.

**යොහාන් 3:14-15** පද වල සඳහන් වන්නේ යේසුස්වහන්සේ අදහන අය සදාකාල ජීවනය නොහොත් මරණින් පසු දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල් වන බවය. මේ ගැළවීම, ලැබීම ලෙස නිර්වචනය කරයි. යේසුස්වහන්සේ අදහා ගැනීම තුලින් තම ජන්මික පාපයට හා තමන් කල පාපයට යන දෙකටම සමාව ලැබී භයානක නිරයේ නොහොත් අපායෙන් තම ආත්මය ගැලවී ස්වර්ගයට යන බව මින් අදහස් වේ.

යේසුස්වහන්සේ සොයාගෙන රාත්‍රියේ පැමිණි නිකදේමුස්ට ලැබුණු පණිවිඩය වූයේ "ඔබ නැවත ඉපදීම ලැබිය යුතුයි" යන්නය. අද ඔබටත් මටත් තිබෙන පණිවිඩයත් එයම ය. මරණින් පසු ස්වර්ගයට යාමට නම් නැවත ඉපදීම ලැබිය යුතුයි. එය ආගමට කල නොහැක. එය කල හැක්කේ දෙවියන්වහන්සේගේ ආත්මයට පමණි. යේසුස්වහන්සේව හනික සොයාගෙන ආ ඊශ්‍රායෙල් ගුරුවරයා තුලින් අපිට දෙන පණිවිඩය නම් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීමට අවශ්‍යනම් නැවත ඉපදීම ලැබිය යුතුය.

## යේසුස්වහන්සේ අදහන්නා පිළිබඳ පද කිහිපයක්

1 **යොහාන් 3:16** - යේසුස්වහන්සේ පුද්ගලිකව අදහා ගැනීමෙන් විනාශයෙන් ගැලවී සදාකාල ජීවනය

2 **යොහාන් 3:36** - යේසුස්වහන්සේ පුද්ගලිකව අදහා ගැනීමෙන් දෙවියන්වහන්සේගේ උදහසින් ගැලවීම.

3 **යොහාන් 5:24** - යේසුස්වහන්සේ පුද්ගලිකව අදහා ගැනීමෙන් දෙවියන්වහන්සේගේ විනිශ්චයෙන් ගැලවීම.

4. **යොහාන් 6:35** යේසුස්වහන්සේ පුද්ගලිකව අදහා ගැනීමෙන් ආත්මික පිපාසය සංසිඳීම.

5. **යොහාන් 6:40** - යේසුස්වහන්සේ පුද්ගලිකව අදහා ගැනීමෙන් තම ශරීරය මළවුන්ගේන් නැගිටීමට පංගුකාරයෙක් බවට පත්වීම.

6. **යොහාන් 11:25** - යේසුස්වහන්සේ පුද්ගලිකව අදහා ගැනීමෙන් මරණයෙන් පසු ආත්මිකව හා ශාරීරිකව නව ජීවනයක් ලැබීම.

**- ගුරුහරු -**

# යේසුස්වහන්සේ සොයාගෙන ආ හමුදා නිලධාරියා - (මතෙව් 8:1-13)

යේසුස්වහන්සේ කපර්ණාවුම නගරයට ඇතුල් වන විට උන්වහන්සේ සොයාගෙන හමුදා අණුකන්ඩයක ප්‍රධානියෙක් පැමිනියේය. ඔහුගේ සේවකයා අංශභාග රෝගී තත්වය නිසා ඔත්පලව සිටින බව ඔහු යේසුස්වහන්සේට පැවසීය. එවිට යේසුස් වහන්සේ **"මම ඇවිත් ඔබගේ මෙහෙකරුවා සුවකරන්නෙමි"** යැයි පැවසූ සේක. එවිට මෙම හමුදා නිලධාරියා මෙසේ කී සේක. "ඔබ වහන්සේ මගේ නිවසට පැමිණීමට තරම් මම නොවටිමී.ඔබ මෙහි සිට සුවය ප්‍රකාශ කරන්න.එවිට මගේ දාසයා සුව වේවි"

මෙම වචන ඇසූ යේසුස්වහන්සේ මහත් පුදුමයට පත්විය. ඒ හමුදා නිලධාරියාගේ ඇදහිල්ල පිළිබඳවය. ඔහු යේසුස්වන්සේගේ බලය පිලිබඳව විශ්වාස කළ අතර තම සේවකයා යේසුස් වහන්සේට සුව කළ හැකි බව ද විශ්වාස කළේය. එපමණක් නොව යේසුස්වහන්සේට දුර සිට ද රෝගීන් සුව කළ හැකි බව ඔහු තරයේ විශ්වාස කළේය.

මෙම පුද්ගලයාගේ තිබුණු ඇදහිල්ල පිළිබඳ යේසුස්වහන්සේ පුදුමයට පත් වූ සේක. උන්වහන්සේ පවසන ආකාරයට, එවැනි විශ්වාසයක්, ඇදහිල්ලක් තිබෙන පුද්ගලයෙකු මින් පෙර උන්වහන්සේට මුණගැසී නොතිබුණි. ඔබත් මමත් යේසුස් වහන්සේ කෙරෙහි තබා තිබෙන ඇදහිල්ල හා විශ්වාසය කෙබඳුද? එය සාමාන්‍ය ආගමික ඇදහිල්ලක් ද නැතිනම් අසහාය වූ තාත්වික ඇදහිල්ලක් ද? මක්නිසාද අපගේ ඇදහිල්ල ප්‍රකාරයටයි දෙවියන්වහන්සේ අප කෙරෙහි ක්‍රියා කරන්නේ.**"ඔබ අදහාගත් ලෙස ඔබට වේවා"!** යැයි යේසුස් වහන්සේ බොහෝ විට පැවසූ සේක **(මතෙව් 9:22).**

යේසුස්වහන්සේ හනික සොයාගෙන ආ මෙම මුලාදෑනියාගෙන් අපට ඉගෙන ගැනීමට තිබෙන පාඩම හෝ ආදර්ශය වන්නේ අවංක ඇදහිල්ල ඇති පුරුෂයකු ස්ත්‍රියක බවට අප පත්විය යුතු බවයි. එසේ වීමට ශුධාත්මයාණන්වහන්සේ අපට උපකාර කරන සේක්වා.

## <u>ඇදහිල්ල පිළිබඳ බයිබල් පද කිහිපයක්</u>

1) **රෝම 4:5** - ඇදහිල්ල කරණකොට ගෙන ධර්මිෂ්ඨ කොට ගනන්ගනු ලැබීම.

2) **ගලාති 3:11**- ඇදහිල්ල කරණකොට ගෙන ජීවත්වීම.

3) **එපීස 2:9** - ඇදහිල්ල කරණකොට ගෙන ගැලවීම ලැබීම.

4). **එපීස 6:16** - ඇදහිල්ල කරණකොට ගෙන නපුරාගෙන් ජයගැනීම.

5) **හෙබ්‍රෙව් 11:6** - ඇදහිල්ල කරණකොට ගෙන දෙවියන්වහන්සේ ප්‍රසන්න කිරීම.

6) **යාකොබ් 5:16** - ඇදහිල්ල කරණකොට ගෙන සුවය/පිහිට ලබා ගැනීම.

7) **1 යොහාන් 5:4** - ඇදහිල්ල කරණකොට ගෙන ලෝකයෙන් ජය ගැනීම.

**- ගුරුහරු -**

# යේසුස්වහන්සේ සොයාගෙන පැමිණි පොහොසත් යෞවනයා - (මතෙව් 19:16-22)

එක් දිනක් යේසුස්වහන්සේ සොයාගෙන තකහනියේ පැමිණියේ පොහොසත් තරුණ මහතෙකි. ඔහු පිළිබඳ කරුණු සොයා බැලීමේදී පෙනෙන්නට තිබෙන්නේ ඔහු සමාජයේ වැදගත් ප්‍රධානියෙකි. එමෙන්ම ආගමික නීති රීති අකුරටම අනුගමනය කර පිළිපදින පුද්ගලයෙකි. එමෙන්ම තරුණයෙකි, පෙහොසතෙකි.

මෙම පොහොසත් තරුණයා යේසුස් වහන්සේ වෙත පැමිණ මෙසේ අසයි. "ගුරුතුමණි සදාකාල ජීවනය උරුමකර ගන්නා පිණිස මා විසින් කුමක් කළ යුතුද?" මෙම ප්‍රශ්නය සෑම මනුෂ්‍යයෙකුගේම හදවතේ ගැඹුරේ සිට පැන නගින ප්‍රශ්නයකි. දැනටමත් මම අනුගමනය කරන හෝ දන්නා දේට වඩා හොඳ හෝ ඊට වඩා වැඩි දෙයක් මට කිරීමට තිබේද? එසේ නැති නම් මම හරිම දේද අදහමින් හෝ කරමින් සිටින්නේ නැතිනම් මම මරණින් පසු යහපත් ජීවිතයක් උරුමකර ගැනීමට කළ යුතු හරිම දේ කුමක්ද? වැනි ගැටළු ඔබ මා ඇතුලු සෑම මනුෂ්‍යයෙකුටම පොදු ප්‍රශ්නාවලියකි.

මෙම පුද්ගලයාද දැනටමත් යුදෙව් ආගමික නීති සංග්‍රහය මුළු සිතින් අදහන හා අනුගමනය කරන පුද්ගලයෙකි. එහෙත් "සදාකාල ජීවනය" පිළිබඳ ඔහුට චකිතයක් තිබුණි.යේසුස් වහන්සේ මෙම තරුණයා සමග සංවාදයක යෙදී, අවසානයේ මෙසේ පැවසූ සේක. "නුඹට එක දෙයක් අඩුය "කුමක්ද ඔහුට අඩු දෙය. කුමක් විය හැකිද? ඔබ සිතන්නේ කුමක්ද? යේසුස්වහන්සේ ඔහුට කීවේ "නුඹ සන්තක දේ විකුණා දිළිඳුන්ට දීපන්න "යේසුස්වහන්සේ ධනවතුන්ට අකමැති නිසාද එසේ කීවේ. නැතිනම් ධනය පාපයක් ලෙස බයිබලය අර්ථ දක්වනවාද? එසේ නොවේ මෙම ධනවත් තරුණයාගේ මුළු විශ්වාසය සහ ඇදහිල්ල තබා තිබුණේ තම ධනය කෙරෙහි බව උන්වහන්සේ දැනගත් සේක. දෙවියන්වහන්සේ පිළිබඳ හැඟීමක් හෝ ප්‍රේමයක්, දැන ගැන්මක් ඔහුට නොතිබුණි. ඔහුට අවශ්‍ය වූයේ මෙලොව විඳින සැප සම්පත් මරණින් පසුවද භුක්ති විඳීමට මාර්ගයක් සොයාගැනීමට පමණි.

ධනයට හෝ යහපත් වැඩ කිරීමෙන් හෝ හොඳ කල්කිරියාවෙන් මරණින් පසු සදාකාල ජීවනය උරුමකර ගැනීමට නොහැකිය. **(යෙසායා 64:6) "අපගේ ධර්මිෂ්ඨ ක්‍රියා දෙවියන්වහන්සේ ඉදිරියේ වැරහැලි මෙන්ය".**

ඔහුගේ වස්තුව පිළිබඳ යේසුස්වහන්සේ කතා කළ සැනින් ඔහුගේ මුහුණ මැළවී ගියේය. එනම් ඔහුගේ සුරක්ෂිතභාවය රඳා පැවතියේ දෙවියන්වහන්සේ කෙරෙහි නොව තම වස්තු සම්භාරය මතය. ලෞකික වස්තුවට, නිළයට, ධනයට,තරාතිරමට හෝ කෙරුවාවට සදාකාල ජීවනය උරුමකරගත නොහැක. එය උරුම වන්නේ තම පාපය ගැන පසුතැවිලි වී ස්වාමී වූ යේසුස් වහන්සේ අදහා ගැනීමෙන් පමණි.

**"උන්වහන්සේ කෙරෙහි අදහන්නා විනාශ නොවී සදාකාල ජීවනය ලබන්නේය" (යොහාන් 3:16).**

මෙහි දී යේසුස්වහන්සේ අවධාරණය කළ වචනය වන්නේ වස්තුව නොහොත් ධනයයි. ධනවත් වීම බයිබලයට විරුද්ධ අදහසක් නොවේ. නමුත් තම අනාගත සුරක්ෂිතභාවය දෙවියන්වහන්සේ මත නොව ධනය මත තැබීම මගින් අපට සදාකාල ජීවනය මගහැරී යා හැක.

## ධනය පිළිබඳ යේසුස් වහන්සේ පැවසූ බයිබල් පද කිහිපයක්

1). **මතෙව් 6:21**- වස්තුව තිබෙන තැන සිතත් (හදවත) තිබේ.

2). **මතෙව් 6:24**- වස්තුවටත් දෙවියන්වහන්සේටත් එකවර සේවය කිරීමට නොහැකිය.

3). **මතෙව් 6:19**- වස්තුව නොහිතන ආකාරයට නැතිවෙනවා, විනාශ වෙනවා.

4). **මතෙව් 19:23**- වස්තුව සදාකාල ජීවනය ලැබීමට බාධා කරයි.

5). **ලූක් 12:6-21**- වස්තුව තාවකාලිකය, මේ ලෝකයට පමණි. ආත්මික අන්ධභාවයට ගෙන එයි.

**- ගුරුහරු -**

# යේසුස්වහන්සේව සොයාගෙන පැමිණි පේත්‍රුස් - (මතෙව් 18:21-35)

පේත්‍රුස් යනු යේසුස්වහන්සේගේ දැනටමත් ගෝලයෙකි. හදිසියේම ඔහු යේසුස්වහන්සේ සොයාගෙන පැමිණ මෙසේ අසයි "මට වරද කරන මාගේ සහෝදරයාට කී වරක් කමා වෙන්ටද?" ඔහු මෙම ප්‍රශ්නයට උත්තරය ලබාග ැනීම උදෙසාම යේසුස්වහන්සේ හමුවට පැමිණියා යැයි මම අනුමාන කරමි. ඔහුට සමාව දීම පිළිබඳ යේසුස්වහන්සේගෙ න් ඉගෙන ගැනීමට අවශ්‍ය වූයේ ඇයි? සමහරවිට ඔහුට කරදර කරන යම් පුද්ගලයෙක් සිටින්නට ඇත. එසේ නැතිනම් අන් ගෝලයෝ 11 දෙනාගෙන් එක්කෙනෙකුගෙන් හෝ කිහිප දෙනෙකුගෙ න් ඔහුට නිතර යම් කරදර ඇතිවන්නට ඇත.එසේ නැතිනම් සමාවදීම පිලිබඳ යේසුස්වහන්සේගේ ඉගැන්වීම ඔහුට දැනගන්නට අවශ්‍ය වූවා විය හැක. ඒ කෙසේ වෙතත් මෙහිදී යේසුස්වහන්සේ උපමා කතාවක් පැවසූ සේක. එය උපයෝගී කරගෙන පේත්‍රුස්ට තමාට වරද කරන අයට සමාවදීමේ ප්‍රතිපත්තිය හා එහි ඇති ස්වර්ගික වැදගත්කම ඉතා මෘදුව සහ සරලව පැහැදිලි කර දුන්සේක.

වරද කරන අය සමාව ඉල්ලන තෙක් හෝ පසුතැවිලි වන තෙක් සිටිය යුතු යැයි උන්වහන්සේ පවසන්නේ නැත. මෙම කතාවේ සිටින රජතුමා දෙවියන්වහන්සේය. පළමු ණය හිමියා මම ය. දෙවැනි ණය හිමියා මට වරද කරන අයය. ඒ අනුව රජතුමා නොහොත් දෙවියන්වහන්සේ මාගේ විශාල වරද නොහොත් පාපය කමා කරන සේක. මට වරද කරන අයගේ වරදට මම සමාව දිය යුතුය. එය මම දෙවියන්වහන්සේට විරුද්ධව කළ වරදට වඩා ඉතා සුළු වරදකි. යේසුස්වහන්සේ හා පේත්‍රුස් අතර සිදු වූ මෙම පුද්ගලික සංවාදයෙන් අපට ගෙනෙන පණිවිඩය වන්නේ අපට වරද කරන අයට 7 x 7 හෝ 70 x 7 නොව සීමා රහිත වාර ගණන් සමාව දිය යුතු බවය.

## සමාවදීම පිලිබඳව යේසුස්වහන්සේ පැවසූ බයිබල් පද කිහිපයක්

1). **මතෙව් 6:14**- දෙවියන්වහන්සේගෙන් කමාව ලැබීමේ කොන්දේසිය- අපට වරද කරන අයට සමාව දීමයි.

2). **මතෙව් 6:15**- කමාව නොලැබීමේ කොන්දේසිය- අපට වරද කරන අයට අප සමාව නොදීම යි.

3). **මතෙව් 18:21**- සමාව දීමේ සීමාව- බයිබලයේ සඳහන් වන්නේ සීමාවක් නොමැතිව නොහොත් සීමා රහිතව සමාව දීමයි.

4). **එපීස 4:32**- සමාව දීමේ ආදර්ශය වන්නේ යේසුස්වහන්සේය.

5). **1යොහාන් 2:12** -කමාව ලැබීමේ සහතිකය වන්නේ දේව වචනයේ යේසුස්වහන්සේව අප අදහා ගැනීම කරණකොටගෙන අපේ පාප කමා කර ඇති බවයි. අදත් සමාව දෙන බවයි.

**- ගුරුහරු -**

# යේසුස්වහන්සේව සොයාගෙන ආ සෙබදීගේ භාර්යාව - (මතෙව් 20:20-24)

මේ අවස්ථාවේ යේසුස්වහන්සේ මුණගැසීමට පැමිණියේ කාන්තාවකි. ඇය සෙබදිගේ භාර්යාවයි. එසේම යොහාන් හා යාකොබ්ගේ මවයි. කවුද මේ යොහාන් සහ යාකොබ්. ඔවුන් දැනටමත් යේසුස්වහන්සේගේ ගෝලයන් 12 දෙනා අතර සිටින දෙදෙනෙකි. ඔවුන් යේසුස්වහන්සේ සමඟ උන්වහන්සේගේ සේවයේ යෙදී සිටිති. ඔවුන් මීට පෙර ඉතා දක්ෂ ධීවරයෝය. සමහරවිට හොඳ ආදායමක් ලැබූ අය විය හැකිය. එහෙත් හදිස්සියේම මේ සියල්ල අහිමි වී ගොස්ය. තම පුතුන් දෙදෙනා රැකියාව අතහැර ගොස්ය. වැඩිය ගෙදර එන්නේද නැත. මේ ගැන ඔවුන්ගේ මවට දැඩි කේන්තියක් මෙන්ම කණගාටුවක් ද තිබෙන්නට ඇත. මේ නිසාම ඇය යේසුස්වහන්සේ සොයාගෙන පැමිණියා විය හැකිය.

මෙහිදි ඇය සිතාගෙන සිටින්නට ඇත්තේ යේසුස්වහන්සේ මේ පොළොවේ රාජ්‍යයක් පිහිටුවා එහි රජ බවට පත්වන බවයි. එහිදි තමන්ගේ පුතුන් වන යොහාන් උන්වහන්සේගේ දකුණු පැත්තේද, යාකොබ් වම් පැත්තේද හිඳගන්නට සලස්වන ලෙස ඇය උන්වහන්සේගෙන් ඉල්ලා සිටියේය. මෙම මවට සහ පුතුන් දෙදෙනාට යේසුස්වහන්සේ මෙසේ පැවසු සේක. **"නුඹලා ඉල්ලන්නේ කුමක්ද කියා නුඹලා දන්නේ නැත" 22 පදය.** යේසුස්වහන්සේ අනාගතයේ දුක්විඳ මරණයට පත්වීමට තිබෙන බව ඔවුන් දැන සිටියේ නැත. උන්වහන්සේ නැවත ඔවුන්ගෙන් ප්‍රශ්ණයක් අසයි "මා බොන්ට නියමිත කුසලානෙන් නුඹලාට බොන්න පුලුවන්ද?" මෙයින් අදහස් කළේ උන්වහන්සේට විදීමට තිබූ දුක් වේදනා හා කුරිරු මරණය පිළිබඳවය. ඔවුන් "පුලුවන් යැයි" උත්තර දුන්නාය. ඔවුන් සිතුවේ මේ පොළොවේ රාජ්‍යයේ සැප සම්පත් පිළිබඳ හා ලෞකික ගරුබුහුමන්, නම්බුනාම, පිළිබඳවය. නුමුත් යේසුස්වහන්සේගේ රාජ්‍යය ආත්මික එකකි. එය ලෞකික හදවතට තේරුම් ගැනීමට නොහැකිය. බොහෝ මිනිස්සුන්ට එය අවබෝධ නොවේ. හැමවිට අප සිතන්නේ මේ ලෝකයට සාපේක්ෂවය. එහෙත් යේසුස්වහන්සේ මිනිසාට ආත්මික විමුක්තිය ගෙන දෙන රාජ්‍යයක් ගොඩනැගීමට තම ජීවිතය කැප කළේය.

මෙහිදි පැන නැගුණු ප්‍රශ්ණය වූයේ යේසුස්වහන්සේට සේවය කිරීම උදෙසා ලැබෙන්නේ කුමක්ද යන්නය. යාකොබ් සහ යොහාන් ගේ මව තකහනියක් යේසුස්වහන්සේ මුණගැසී තම දරුවන්ට අනාගතයේදී ලැබෙන්නේ කුමක්දැයි විමසා සිටියේ මේ නිසාය. ඇත්තටම යේසුස්වහන්සේගේ සේවයේ යෙදී සිටින අයට මේ ලෝකයේදී ලැබෙන ගරු බුහුමන් මොනවාද? කිසිවක් නැත, දුක්විදීම පමණි. නමුත් යේසුස්වහන්සේට සේවය කරන අයට උන්වහන්සේ යමක් පොරොන්දු වී ඇත්ද?. ඒ මොනවාද? විමසා බලන්න.

**යොහාන් 12:26 - යමෙක් මට සේවය කෙරේ නම් ඔහු මා අනුව ඒවා. මම යම් තැනක සිටිම්ද එතැන මාගේ සේවකයාද සිටින්නේය. යමෙක් මට සේවය කෙරේ නම් ඔහුට මාගේ පියාණන්වහන්සේ ගෞරව කරන සේක.**

**- ගුරුහරු -**

# යේසුස්වහන්සේව සොයාගෙන ආ උන්වහන්සේගේ මෑණියෝ සහ පවුලේ අය

## - (මාර්ක් 3:31-35)

මේ අවස්ථාවේ යේසුස්වහන්සේ සොයාගෙන පැමිණ තිබුනේ උන්වහන්සේගේ මව සහ පවුලේ අයයි. ඔවුන් පැමිණියේ යේසුස්වහන්සේ බැහැදැකීම පිණිසයි.එහෙත් එතන සෙනග පිරී සිටි බැවින් ඔවුන්ට උන්වහන්සේ ළඟට යාමට නොහැකි විය. එවිට එක් අයෙකු ගෙයි ඇතුළට ගොස් මේ පණිවඩය උන්වහන්සේට පැවසුවේය. එහෙත් උන්වහන්සේ ඒ ගැන වැඩි සැලකිල්ලක් නොදක්වා ඒ ආකාරයෙන්ම සිටි සේක. තවද උන්වහන්සේ තමන් අවට වාඩි වී සිටි සෙනග පෙන්වා "මෙන්න මාගේ මෑණියෝත්, සහෝදරයෝත්" යැයි පැවසූ සේක. තවද මෙසේද පැවසූ සේක. "ස්වර්ග යේ සිටින දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන කවුරු නමුත් මාගේ මෑණියෝත් මාගේ සහෝදරයෝත්ය" ඉන් පසුව සිදු වූයේ කුමක් දැයි බයිබලයේ ලියා නැත. අපිත් නොදනිමු.

මෙහිදී යේසුස්වහන්සේ තම මෑණියන්ට හෝ පවුලේ අයට අගෞරව කළේ නැත. ඔවුන් සුලු කලේද නැත. සමහරවිට උන්වහන්සේගේ දේශනාව අවසන් කොට පසුව ඇවිත් ඔවුන් සමඟ කතා බහ කිරීම සිදුවන්නට ඇත.

යේසුස්වහන්සේ සඳහන් කළේ උන්වහන්සේගේ ලෞකික පවුලට වඩා ආත්මික පවුල පිළිබඳවය. " දෙවියන්වහන්සේගේ වචනය පිළිගෙන විශ්වාස කරන හා උන්වහන්සේගේ කැමැත්ත අනුව ජීවත්වන අය යේසුස්වහන්සේගේ ආත්මික පවුල ලෙස උන්වහන්සේ ප්‍රකාශ කල සේක". ඔබත් මමත් යේසුස්වහන්සේගේ ආත්මික පවුලට අයිති වීමට නම් අපිත් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන අය විය යුතුයි.

### යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත පිළිබඳ පැවසූ දේ.

01. **මතෙව් 6:10** - දෙවියන්වහන්සේගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළොවේද කරනු ලැබේවා.

02. **මතෙව් 7:21** - දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන අය පමණක් ස්වර්ගයට ඇතුල් වේ.

03. **මතෙව් 12:50** - දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන අය යේසුස්වහන්සේගේ සහෝදර සහෝදරියෝ ලෙස ගනන්ගනු ලැබේ.

04. **යොහාන් 4:34** - දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම තමාගේ කෑම බීම මෙන් අත්‍යවශ්‍යය කාරණයක් බව යේසුස්වහන්සේ පැවසූසේක.

05. **යොහාන් 5:30** - තමන්ගේ කැමැත්ත නොව දෙවියන්වහන්සේගේ කැමැත්ත නිතරම සෙවිය යුතුය.

07. **යොහාන් 6:40** - සියලු මනුෂ්‍යයන් කෙරෙහි දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ යේසුස්වහන්සේ අදහා සදාකාල ජීවනය ලැබීමය.

08. **යොහාන් 9:31** - දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන අයගේ යාච්ඤාව පමණක් උන්වහන්සේ අසන සේක.

**- ගුරුහරු -**

# යේසුස්වහන්සේ සොයාගෙන ආ ස්ත්‍රිය - (මතෙව් 26:6-13)

අද අපි බලන්න සූදානම් වන්නේ බෙතානියේදී සීමොන්ගේ ගෙදර යේසුස්වහන්සේ සිටින විට උන්වහන්සේව සොයාගෙන ආ කාන්තාව පිළිබඳවය. එහිදී ඇය ඉතාම වටිනා හා අනර්ඝ සුවඳ තෙල් භාජනයක් රැගෙන පැමිණියාය. සාමාන්‍යයෙන් එය එවකට යම් පුද්ගලයකුගේ වාර්ෂික වැටුපට සමාන මුදලක් ලෙස වටින බව ගණන් බලා ඇත. තවද ඉතුරු කරන ධනය ලෙසද හඳුන්වයි.

මේ ස්ත්‍රිය යේසුස්වහන්සේ ළඟට ගොස් එම භාජනය බිඳ එම තෙල් යේසුස්වහන්සේගේ හිසේ වත්කලාය. එවකට එම සමාජයේ ගෞරව කරන ඉහල ආකාරය ලෙස එසේ තෙල් හිස මත වත් කිරීම සැලකිය හැකිය. මෙවැනි සිදුවීමක් **යොහාන් 12** පරිච්ඡේදයෙහි සඳහන්ව ඇත. එහි ඇය එම තෙල් යේසුස්වහන්සේගේ පාද ආලේප කොට ඇගේ හිසේ කෙස් වලින් පිස දැමුවාය ලෙස සඳහන් වේ. එම සිදුවීම් දෙක එක සිදුවීමක් ද නැතිනම් සිදුවීම් දෙකක්ද විය හැක.

මෙහිදී අවට සිටි අය ඇයට දොස් තැබූ අතර යේසුස්වහන්සේ ස්ත්‍රිය කළ ක්‍රියාව අගය කළ සේක. උන්වහන්සේ ඇයට ප්‍රශංසා කළසේක. එපමණක්ද නොව ඒ ගැන අනාගතවාක්‍යයක්ද උන්වහන්සේ පැවසූ සේක.

නමක් සඳහන් නොවන මෙම කාන්තාවට යේසුස්වහන්සේ මුණගැසී කළ ක්‍රියාවෙන් කුමක්ද අපට ගත හැකි ආදර්ශය හෝ පණිවිඩය.

*"පරිත්‍යාගශීලී නමස්කාරය"* ලෙස හැඳින්වීම නිවැරදි යැයි මම සිතමි. අප කැඳවා ඇත්තේ දෙවියන්වහන්සේට නමස්කාර කිරීමටය. එය යම් ආකාර වියදමක් කර, කැපවීමක් සහිතව කිරීමටය. දෙවියන්වහන්සේට නමස්කාර කිරීම බොහෝ සෙයින් එය අගනා ක්‍රියාවකි. දෙවියන්වහන්සේ ඉදිරියට පැමිණෙන විට හිස් අතින් නොව යම් පඬුරක් රැගෙන පැමිණීම අපගේ සේවය වේ. මක්නිසාද උන්වහන්සේ අප උදෙසා තම ජීවිතය පරිත්‍යාග කර අප මහත් විනාශයෙන් මුදාගෙන තිබේ. අපිත් යේසුස්වහන්සේට පරිත්‍යාගශීලිව නමස්කාර කරන්නෙකු වෙමු. මෙම සිදුවීමෙන් යේසුස්වහන්සේ අපට උගන්වන්නේ පරිත්‍යාගශීලි නමස්කාරය පිළිබඳවය.

## දෙවියන්වහන්සේට නමස්කාර කිරීම පිළිබඳ බයිබල් පද කිහිපයක්

1 **මතෙව් 4:10** - දෙවියන්වහන්සේට පමණක් නමස්කාර කරන්න.

2 **මාර්ක් 7:7** - දෙවියන්වහන්සේට . නිරර්ථකයේ නමස්කාර නොකරන්න.

3 **යොහාන් 4:24** - දෙවියන්වහන්සේට සැබෑකමින් හා ආත්මයෙන් නමස්කාර කරන්න.

4 **යොහාන් 4:23** - දෙවියන්වහන්සේ තමන්ට නමස්කාරකරන්නන් සොයන සේක.

**- ගුරුහරු -**

# ඉවත්කර ගැනීමේ මෙහෙයුම



**"මෙන්න නුඹලාට රහසක් කියමි, අපි සියල්ලෝම නොසැතපෙන්නෙමුව. නමුත් අන්තිම හොරණෑව පිඹින කල මොහොතකින් ඇසිපිය හෙලන ක්ෂණයකින් අපි සියල්ලෝම වෙනස් කරනු ලබන්නෙමුව" (1 කොරින්ති 15: 51,52).**

**"එවිට ජීවත්ව ඉතිරිව සිටින අපි එක විටම ඔවුන් සමඟ ස්වාමීන්වහන්සේ සම්මුඛ වන පිණිස වළාකුළුවලින් අහසට ඇදගනු ලබන්නෙමුව" (1 තෙසලෝනික 4:17).**

අප දැන් ජීවත්වන කාල වකවානුව කොපමණ තීරණාත්මක දැයි අප අවට සිදුවන දේ බැලූ විට ඔබට ඒත්තු යනවාට සැක නැත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්නාටත් නොඅදහන්නාටත් ඉන් බලවත් අනතුරු ඇඟවීමක් කෙරේ. එහෙත් එවන් අනතුරු ඇඟවීමකට වඩා බෙහෙවින් ශ්‍රේෂ්ඨ වූ යමක් බයිබලය අපට පවසයි. එය නම් කිතුණු ඇදහිලිවන්තයා ඉදිරිපිට තිබෙන තේජවත් සහ ආශිර්වාදලත් බලාපොරොත්තුවයි. මතුවට සිදුවෙන්නට තිබෙන සියලු දෙයින් අති ශ්‍රේෂ්ඨතම සිදුවීම මේ යැයි සහතික ලෙස පැවසිය හැකිය. එය දෙවියන්වහන්සේ තම දරුවන් පොළෝතලයෙන් ඉවත් කරගැනීමේ මහා මෙහෙයුමයි. මෑතකදී ජපානයේ සිදුවූ භූමිකම්පාවෙන් අනතුරුව න්‍යෂ්ටික බලාගාර වලින් විකිරණශීලී කිරණ කාන්දු වීමේ අවදානම ඇති වූ විට ජපාන රජය කලේ එම බලාගාර අවට කිලෝ මීටර 20ක් දුරට ජීවත් වූ සියලු මිනිසුන් ඉවත් කර ගැනීමේ මෙහෙයුමක් දියත් කර ගැනීමයි. මෙවැනිම ඉවත් කර ගැනීමේ මෙහෙයුමක් දෙවියන්වහන්සේ විසින්ද සැළසුම් කර තිබේ. ඔබ සෑම කෙනෙකුම අලුත් ගිවිසුම කියවීම තුලින් දැනගන්න කරුණු අතරෙන් වැදගත්ම කරුණ මෙයයි. මෙයට සභාව ඔසවා ගැනීම යැයි නම් දී තිබේ.

**"මාගේ ඉවසීමේ වචනය නුඹ රක්ෂා කල හෙයින් පොළොවේ වසන්නන් පරීක්ෂා කිරීමට මුළු ලෝකය පිටට පැමිණෙන්නට තිබෙන්නාවූ පරීක්ෂාවේ පැයෙන් මමත් නුඹ ආරක්ෂා කරන්නෙමි" (එළිදරව් 3:10).** සභාවට දෙනු ලැබූ මෙම අගනා පොරොන්දුව ඉටු වීමට දැන් කාලය එළඹ ඇත. "මුළු ලෝකයා පිටට පැමිණෙන්න තිබෙන පරීක්ෂාවේ පැය" දැන් අත ළඟය. ඇත්තෙන්ම එහි ආරම්භක ලකුණු දැනටමත් අපි දකිමු. එහෙත් මහා පීඩාව සහ වින්නැහිය ආරම්භ වීමට ප්‍රථම යේසුස්වහන්සේ තම සභාවට වූ පොරොන්දුව ඉටු කරමින් ඇදහිලිවන්ත සමූහයා මෙලොවින් ඉවත් කරගනු ඇත. මෙය අපට හිතාගන්ටවත් බැරි තරම් අපුරු අත්දැකීමක් වනු ඇත. එවිට ඇසි පිය හෙළන ක්ෂණයකින් අපි සියල්ලෝම වෙනස් කරනු ලබනු ඇත. එනම් අපගේ මේ ශරීර තේජවත් සිරුර බවට වෙනස් වනු ඇත. ඊළඟට සිදුවන්නේ අපූර්ව දෙයකි. "එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ..... ස්වාමීන්වහන්සේ සම්මුඛ වන පිණිස වලාකුළු වලින් අහසට ඇදගනු ලබන්නෙමුව" මෙසේ අප හිටිහැටියේම ගුවන් ගත වීමක් සිදුවීමට නියමව තිබේ. ස්වාමීන්වහන්සේ අප ගෙන යෑමට පැමිණෙන බවට දේව වචනයෙහි නැවත නැවතත් පොරොන්දු වී තිබේ. අප බලාපොරොත්තු නොවන මොහොතකදී තමන් පැමිණෙන බව යේසුස්වහන්සේ පැවසූ සේක.

**"එබැවින් සෑදී සිටපල්ලා, මක්නිසාද නුඹලා නොසිතන පැයකදී මනුෂ්‍ය පුත්‍රයා එනසේක" (මතෙව් 24:44).**

**"මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරම් නම්.... මම නැවත ඇවිත් නුඹලා මා ළඟට**

**ගන්නෙමි" (යොහාන් 14:3).**

ඉහත කී ගුවන් ගත වීමට ඔබ සූදානම්ද? එය ඕනෑම මොහොතක සිදුවිය හැකිය. එම සිදුවීමෙන් අනතුරුව මිහිපිට දිගහැරෙන සිදුවීම් මාලාව සඳහා කාලය එළඹ ඇති බව ඉහත පරිච්ඡේද වලින් අපි දුටුවෙමු. අවසන් සිදුවීම් මාලාවේ ආරම්භය ඇදහිලිවන්ත සමූහයා ස්වර්ගයට ඔසවා ගැනීමයි. පිටසක්වල ආක්‍රමණයකින් මිනිසුන් ඩැහැ ගන්නා ලදැයි සාවද්‍ය පැහැදිලි කිරීමක් මෙම සිදුවීමට ආරූඪ කරනු ඇත. එහෙත් සත්‍ය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන ඔබත් මමත් ස්වර්ගාරෝහණය වීමය.

අනාගතයට සිදුවන්නට තිබෙන වැදගත්ම සිදුවීම පිළිබඳව දැන් ඔබ දැනුවත්ව සිටී. එම දැනුම මගින් ඔබ පිට පැවරෙන්නේ අති මහත් වගකීමකි. ලෝකය අභාග්‍ය සම්පන්න ලෙස විනාශය කරා ගමන් කරමින් සිටියි. එහෙත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ස්වර්ගික හා සදාකාලික පවුලට ඇතුලත් වීම සඳහා ඔබට ආරාධනා කරන සේක. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මීට වසර 2000 ට පෙර මෙලොවට පැමිණීමත්, අප එකිනෙකාගේ පාප සහ වරද උදෙසා ජීවිත පූජාව මගින් දඬුවම් ගෙවා දැමීමත් නිසා දෙවියන්වහන්සේගේ පවුලට ඇතුලත් වීම දැන් අපට පහසු කර දී තිබේ.

## එය දීමනාවකි

**"පාපයේ කුලිය නම් මරණයයි. නමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනයයි" (රෝම 6:23).**

පාප කමාව ඔබ ලබා ගත හැක්කේ දෙවියන්වහන්සේ ඔබට දෙන දීමනාවක් නොහොත් තෑග්ගක් හැටියට පමණකි. ඔබටම එය උපයා ගත නොහැකිය. ඔබ එය ලබා ගැනීමට සුදුස්සෙකු ද නොවේ. එහෙත් දෙවියන්වහන්සේ තම කරුණාවෙන් ඔබ වෙත පාප කමාව ප්‍රදානය කරන සේක. ඒ සමගම දෙවියන්වහන්සේ සමග නිරන්තර සම්බන්ධතාවයක් ඔබට හිමි වේ. ඔබට මෙම තෑග්ග ලැබීමට අවශ්‍ය නම් පහත සඳහන් වචන කිහිපය හිතේ අවංකකමින් කියන්න.

මෙම වචන යොමු කරන්නේ දෙවියන්වහන්සේ වෙතටයි. මෙය දෙවියන්වහන්සේට කරන කෙටි යාච්ඤාවකි.

**"දයාබර දෙවියන්වහන්ස, මම පව්කරුවෙකු බව පිළිගනිමි. මාගේ පාප වල දඬුවම ගෙවීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසියක් මත තමන් ජීවිතය පූජා කිරීම ගැන ඔබවහන්සේට ස්තූති කරමි. ඔබ වහන්සේ පිරිනමන පව් කමාව මම මේ මොහොතේදීම පිළිගනිමි. දයාබර යේසුස්වහන්ස, මේ මොහොතේදීම මගේ සිත තුළට ඇතුල්වුව මැනව. ඔබවහන්සේ මේ දැන් මට පව්කමාවත් සදාකාල ජීවනයත් ලබා දුන් බැවින් ඔබවහන්සේට ස්තූති වේවා.<br>ආමේන්..."**

අවසාන වශයෙන් යේසුස්වහන්සේ පැවසූ මෙම වදන් විශ්වාස කරන්න. "මා වෙතට එන තැනැත්තේ මම කිසිසේත් අහක නොදමන්නෙමි" (යොහාන් 6:37). යේසුස්වහන්සේ දැන් ඔබව පිළිගෙන තිබෙනවා පමණක් නොව ඔබගේ සිත තුල ජීවත් වීමටත් පැමිණ සිටියි. එහි සැබෑ අරුත නම් ඔබ අලුත් පුද්ගලයකු බවට පත්ව සිටීමයි. දෙවියන්වහන්සේ අලුත් ජීවිතයක් දැන් ඔබට දී තිබේ.

## දෙවියන්වහන්සේ තුළ නව ජීවිතය

ඉහත ඡේදයෙහි සඳහන් වූ යාච්ඤාව අවංක සිතින් කල විට ඔබගේ සිත තුලට යේසුස්වහන්සේ ඇතුල් වූයේ ශුද්ධාත්මයාණන් එනම් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙනයි. මින් ඉදිරියට ඔබගේ ජීවිතයේ දිව්‍ය මාර්ග උපදේශකයා වන්නේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේය. ශුද්ධ වූ බයිබලය ඔබට අවශ්‍ය දැනමුතුකම් හා අවශ්‍ය උපදෙස් ලබාදෙන පොතකි. දැන් ඔබට තිබෙන්නේ දෙවියන්වහන්සේ අදහන්නාවූ කෙනෙකු ලෙස ජීවිතය ඉදිරියට ගෙන යෑමයි.

**"යුගාන්තයක පෙර නිමිති"<br>- පොතෙන් උපුටා ගන්නා ලදී -**

2024 නව වසර ඔබ සැමට දෙවියන්වහන්සේගේ
ආශිර්වාදය, කරුණාව, අනුග්‍රහය බහුල
# නව වසරක් වේවා !

## - නව වසරේ අභියෝග -

★ දිනපතා බයිබලය පිළිවෙලින් කියවමු.
★ වඩ වඩා දෙවියන්වහන්සේට කථා කරමු.
★ සෑම ඉරූ දිනකම සභාවට යමු.
★ සතුටු සිතින් දෙවියන්වහන්සේට පූජා කරමු
★ එකිනෙකා ඇදහිල්ලෙන් ශක්තිමත් කරමු.
★ අපට වරද කරන අයට නිතර සමාව දෙමු.
★ අපේ දරුවන්ට දෙවියන්වහන්සේ පිළිබඳ කියා දෙමු.
★ එකිනෙකාට හැකි පමණින් උපකාර කරමු.

www.christianfellowshipcentre.com
Cfc Colombo (Christian Fellowship Centre)
CFC Colombo


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com